# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන.

මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නිකවැව ග්‍රාම නිලධාරී වසමේ ක්‍රියාත්මක ව්‍යාපෘතිය සඳහා වූ ඇගයීම් වාර්තාව.

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි
එන්.පී.පී.සමන්ත
එම්.කේ.එන්.දමයන්ති
සාගරිකා හිටියාමු

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.
114, විජේරාම මාවත
කොළඹ 07.

2003 දෙසැම්බර්

711.3
(SL)

2009/06 2010/04 225/-

# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන.

මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නිකවැව ග්‍රාම නිලධාරී වසමේ ක්‍රියාත්මක ව්‍යාපෘතිය සඳහා වූ ඇගයීම් වාර්තාව.

MFA/ 5876

පර්යේෂණ කණ්ඩායම
ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි (අධි පර්යේෂක)
එන්.පී.පී. සමන්ත (පර්යේෂණ නිලධාරී)
එම්.කේ.එන්. දමයන්ති (පර්යේෂණ නිලධාරී)
සාගරිකා හිටිහාමු (පර්යේෂණ නිලධාරී)
එල්.පී.ආරියරත්න (සංඛ්‍යාන සහකාර)

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත
කොළඹ 07.

2003 දෙසැම්බර්

21455

21455

පුස්තකාලය
LIBRARY
HARTI

| පටුන | | පිටුව |
|---|---|---|


01. පළමුවන පරිච්ඡේදය

තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන පිළිබඳව හැඳින්වීම 01-08

1.1 පිවිසුම

1.2 තිරසාර සංවර්ධන ගම්මාන වැඩසටහන

1.3 ව්‍යාපෘතියෙහි අරමුණු

1.3.1 දිගුකාලීන බලාපොරොත්තු (අභිමතාර්ථ)

1.3.2 කෙටිකාලීන බලාපොරොත්තු (අරමුණු)

1.4 උපාය මාර්ග

1.5 ක්‍රියාමාර්ග

1.6 යෙදවුම්

1.7 නිමැවුම්

1.8 සම්බන්ධීකරණය

1.9 මූල්‍ය පහසුකම

1.10 ව්‍යාපෘති ප්‍රදේශ තෝරාගැනීම

1.11 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ආයතනයේ කාර්යභාරය

1.12 මෙම ඇගයීම් අධ්‍යයන වාර්තාව

1.13 ක්‍රමවේදය

02. දෙවනි පරිච්ඡේදය

තිකවැව ග්‍රාමනිලධාරී වසමෙහි සමාජ ආර්ථික ලක්ෂණ 09-32

2.1 පිහිටීම

2.2 ඓතිහාසික තත්ත්වය

2.3 ජනගහනය හා එහි ලක්ෂණ

2.4 ප්‍රධාන ආර්ථික කටයුතු

2.4.1 රැකියා වියුක්තිය

2.4.2 ඉඩම් අයිතිය, භුක්තිය හා ඉඩම් ආශ්‍රිත ගැටළු

2.4.3 කෘෂිකර්මය

2.4.4 සත්ත්ව පාලනය

2.4.5 ස්වයං රැකියා (ගොවිපළ නොවන කාර්යයන්)

2.5 අධ්‍යාපන තත්ත්වය

2.6 නිවාසවල තත්ත්වය හා අයිතිය

2.7 සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම්

2.8 ග්‍රාමීය ප්‍රජා සංවිධාන හා ඒවායේ ක්‍රියාකාරකම්

2.9 කාන්තාවන් හා තරුණයන්ගේ තත්ත්වය

03. තුන්වන පරිච්ඡේදය
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 33-37
3.1 ආයතනික ප්‍රවේශය
3.2 ග්‍රාමීය ප්‍රවේශය
3.3 සහභාගීත්ව ගැමි විමසුම
3.4 සැළසුම් සැකසීම
3.5 සංවිධානාත්මක හා කළමනාකරණ ව්‍යුහය
3.6 ජනතා සහභාගීත්වය ලබාගැනීම හා ඔවුන් ක්‍රියාකාරීත්වයට පත්කිරීම
3.7 ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතු

04. හතරවන පරිච්ඡේදය.
ව්‍යාපෘතියෙහි බලපෑම් සහ අරමුණු සඵල කර ගැනීම. 38-47
4.1 සංවර්ධන කටයුතු වල බලපෑම
4.2 ව්‍යාපෘතියෙහි නිමැවුම් සහ එහි බලපෑම
4.3 කෙටිකාලීන හා දිගුකාලීන ව්‍යාපෘති අරමුණු ඉටුවීම.

05. පස්වන පරිච්ඡේදය
පාඩම් අත්දැකීම් හා ගැටළු 48-49

5.1 පාඩම් හා අත්දැකීම්
5.2 ප්‍රශ්න හා ගැටළු

06. හයවන පරිච්ඡේදය 50
නිගමන හා යෝජනා
6.1 නිගමන
6.2 යෝජනා

සංඛ්‍යා සටහන් නාමාවලිය　　　　　　　　　　　　　　පිටුව


| | | |
|---|---|---|
| 2.1 | සාමාජික සංඛ්‍යාව අනුව පවුල් ව්‍යාප්තිය (නිකවැව වසම) | 10 |
| 2.2 | වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහන ව්‍යාප්තිය (නිකවැව වසම) | 11 |
| 2.3 | පවුලේ සාමාජිකයින් නිරතවන ප්‍රධාන රැකියාවන් (නිකවැව වසම) | 12 |
| 2.4 | පවුලේ සාමාජිකයින් නිරත වන ද්විතීයික රැකියාවන් (නිකවැව වසම) | 14 |
| 2.5 | පවුලේ සාමාජිකයින් නිරතවන කාර්යයන් (නිකවැව වසම) | 15 |
| 2.6 | විවිධ වූ අයිතීන් හා බුක්තික්‍රම යටතේ පරිහරණය කරන ඉඩම් ප්‍රමාණයන් හා ප්‍රතිශතයන් (නිකවැව වසම) | 16 |
| 2.7 | විවිධ ප්‍රමාණයන් යටතේ ඉඩම් පරිහරණය කරනු ලබන පවුල් ඒකක ප්‍රමාණයන් හා ප්‍රතිශතයන් | 17 |
| 2.8 | ඉඩම් ආශ්‍රිත ගැටළු (නිකවැව වසම) | 18 |
| 2.9 | සත්ත්ව නිරත පවුල් ප්‍රමාණයන් හා ප්‍රතිශතයන් (නිකවැව වසම) | 21 |
| 2.10 | ස්වයං රැකියා ක්‍රියාකාරකම් (නිකවැව වසම) | 22 |
| 2.11 | වැඩිහිටි සාක්ෂරතා මට්ටම (නිකවැව වසම) | 24 |
| 2.12 | නිකවැව ග්‍රා.නි. වසමේ පවුල් සාමාජිකයින්ගේ අධ්‍යාපන මට්ටම | 25 |
| 2.13 | ගෘහමූලිකයන්ගේ අධ්‍යාපන මට්ටම (නිකවැව වසම) | 26 |
| 2.14 | නිවාස අයිතියේ ස්වභාවය (නිකවැව වසම) | 27 |
| 2.15 | වාහනයකින් ප්‍රවේශවීමේ හැකියාව අනුව නිවාස (නිකවැව වසම) | 27 |
| 2.16 | ගොඩනැගිලි තැනීමට භාවිතා කරන් ද්‍රව්‍ය අනුව නිවාස (නිකවැව වසම) | 28 |
| 2.17 | ගම්වාසීන්ගේ සෞඛ්‍ය තත්ත්වය - ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව (නිකවැව වසම) | 29 |
| 2.18 | ජලය සපයාගන්නා මූලාශ්‍ර (නිකවැව වසම) | 30 |
| 2.19 | විවිධ අවශ්‍යතා සඳහා කුටුම්භයන් ජලය සපයාගන්නා මූලාශ්‍රයට පවතින දුර | 31 |
| 2.20 | විවිධ සංවිධාන තුළ පවුල් නියෝජනය (නිකවැව වසම) | 31 |
| 3.1 | වගුව- නිකවැව වසම තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන කාර්යයන් | 34 |
| 3.2 | වගුව - නිකවැව වසම තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන කාර්යයන් | 37 |
| 4.1 | නිකවැව වසම තුළ සිදුකළ ඒ ඒ සංවර්ධන කාර්යයන්හි නිමැවුම් හා බලපෑම් | 39 |
| 4.2 | නිකවැව වසම තුළ සිදුකළ ඒ ඒ සංවර්ධන කාර්යයන්හි නිමැවුම් හා බලපෑම් | 40 |
| 4.3 | නිකවැව වසම තුළ සිදුකළ ඒ ඒ සංවර්ධන කාර්යයන්හි නිමැවුම් හා බලපෑම් | 41 |
| 4.4 | නිකවැව වසම තුළ සිදුකළ ඒ ඒ සංවර්ධන කාර්යයන්හි නිමැවුම් හා බලපෑම් | 42 |
| 4.5 | නිකවැව වසම තුළ සිදුකළ ඒ ඒ සංවර්ධන කාර්යයන්හි නිමැවුම් හා බලපෑම් | 43 |
| 4.6 | නිකවැව වසම තුළ සිදුකළ ඒ ඒ සංවර්ධන කාර්යයන්හි නිමැවුම් හා බලපෑම් | 44 |
| 4.7 | ව්‍යාපෘතිය යටතේ කෙටිකාලීන අරමුණු ඉටුවී ඇති ප්‍රමාණය | 47 |

# පළමුවන පරිච්ඡේදය

# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන පිළිබඳව හැඳින්වීම

## 1.1 පිවිසුම

ආර්ථික හා සමාජීය වශයෙන් වඩා වැදගත් වූ මෙරට පාරිභෝගික කෘෂිකාර්මික ක්ෂේත්‍රය මෑතක සිට වඩාත් පසුගාමී හා ආකාර්යක්ෂම එකක් බවට පත්ව ඇත. රටෙහි ජනගහණයෙන් 75% ක් පමණ ග්‍රාමීය අංශයෙහි ජීවත් වන අතර ශ්‍රම බලකායෙන් 35% ක් පමණ සෘජුව හෝ වක්‍ර අන්දමින් කෘෂිකර්මය හා සම්බන්ධ කටයුතු වල නියුතුව ජීවිකාව කරගෙන යති. මුළු ජනගහණයෙන් 70% ක් පමණ කෘෂිකර්මය මත යැපෙති. මෙතරම් වැදගත් කමක් දරනු ලබන දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ මෑත භාගයේ දැකගත හැකි ප්‍රවනතා වන්නේ අඩු නිෂ්පාදන ඵලදායීතාවය, අඩු ආදායම්, වැඩි නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් මිළක් නොලැබීම හා එය උච්චාවචනයට භාජනය වීම, රැකියා හිඟයක් පැවතියදී වුවද ජනතාව කෘෂිකර්මයෙන් තව තවත් බැහැර වීම යනාදියයි. මේ තත්ත්වය ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ආර්ථික තත්ත්වය පහළ බැසීමටත් දුප්පත්කම වර්ධනය වීමටත් හේතු වී ඇත.

නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් යටතේ වර්තමාන ග්‍රාමීය ක්ෂේත්‍රය මුහුණ පා ඇති ඉහත දැක්වූ අභියෝග ජය ගැන්ම තුළින් සමෘද්ධිමත් ගොවිජන සමාජයක් බිහි කිරීම සඳහා යොමු වූ නව ව්‍යාපෘතියක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ආරම්භ කරනු ලැබ ඇති අතර එය "තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන" වේ. මෙම වැඩ සටහන කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍ය ගරු එස්.බී. දිසානායක ඇමතිතුමාගේ අදහසක් හා දිරිගැන්වීම මත ඇරඹීම සුවිශේෂ වූ කරුණකි.

## 1.2 තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන

ඉහත දැක්වූ පරිදි විවිධාකාර වූ ප්‍රශ්න ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ පැවතියද ඒවා බොහොමයක් විසඳීම සඳහා අවශ්‍ය සම්පත් හා හැකියාවන් එම ක්ෂේත්‍රය තුළම පවතී. එවැනි දෑ හඳුනා ගැනීමත්, ඒවා විධිමත් පරිදි උපයෝගී කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික, කළමනාකරණ හා සංවිධානාත්මක විධි හා ක්‍රමෝපායන් පිළිබඳව අත්හදා බැලීමත් සඳහා ආරම්භ කරනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘතිය "තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන" වෙයි.

මෙම වැඩසටහන යටතේ දිවයිනේ විවිධ කෘෂි දේශගුණික කලාපයන්ගෙන් "ක්ෂේත්‍ර පර්යේෂණාගාර" ලෙස තෝරා ගනු ලැබූ ගම් "ආදර්ශන" හෙවත් "ආදර්ශ ගම්මාන" ලෙස දියුණු කිරීමට උත්සාහ ගනු ලැබිණ. එසේ කරනු ලැබුයේ එම ගම්වල කරනු ලැබූ විවිධ අත්හදා බැලීම් එම ගම් තුළම භාවිතයට සැලැස්වීමෙන් වූ අතර එවැනි ආදර්ශ ගම්මාන බිහි කිරීමේ අරමුණ වූයේ අසල්වැසි අනෙකුත්

ගම්වලටත් වලටත් එවැනි සාර්ථක අත්දැකීම් අනුගමනය කිරීම තුළින් දියුණුව සලසා ගැනීමට අවස්ථාව ලබා දීමය.

මෙම වැඩසටහනෙහි මූලික ලක්ෂණ වන්නේ ඒකාබද්ධ සංවර්ධනය, සහභාගීත්ව ප්‍රවේශය හා තිරසර භාවයයි. ග්‍රාමීය සංවර්ධනයේදී බෝග හා නිෂ්පාදනවල විවිධාංගීකරණය, ආර්ථික කටයුතු වලට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍ය, යටිතල පහසුකම් ආදී වූ සමාජ හා අනෙකුත් අංශයන්හි සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම, සංවර්ධනය සඳහා දායක කරගත හැකි සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලත් ජනතාවගේත් සහභාගීත්වය හා සහයෝගය ඒ සඳහා උපරිම අන්දමින් ලබා ගැනීම හා පාරිසරික සමතුලිතාව මෙන්ම ආරම්භ කරනු ලබන ආර්ථික කටයුතු හා සංවිධානාත්මක ක්‍රමෝපායන් ඇතුළත් සංවර්ධනාත්මක ක්‍රියාවලියෙහි දිගුකාලීන පැවැත්ම කෙරෙහි වැඩසටහන යටතේ විශේෂ අවධානය යොමු කිරීමට අපේක්ෂා කෙරිනි.

## 1.3 ව්‍යාපෘතියෙහි අරමුණු

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අංග දෙකකින් සමන්විත වන අතර ඉන් ප්‍රධාන අංගය වන්නේ ඉහත දැක්වූ ආකාරයට ග්‍රාමීය සංවර්ධනය සඳහා කෙළින්ම හා ප්‍රායෝගිකව මැදිහත් වීමය. ඒ යටතේ අනෙකුත් ගැමියන් පෙළඹවීම සඳහා විවිධ අත්හදා බැලීම් සිදු කරමින් ආදර්ශ ගම් බිහිකරනු ලැබේ. එහි දෙවන අංගය වන්නේ තොරතුරු සැපයීම තුළින් වඩා අයුරින් ග්‍රාමීය සංවර්ධනය සඳහා දායක වීමය. ඒ යටතේ කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධනය සඳහා රජය අනුගමනය කරන්නා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කෙරෙහි ග්‍රාමීය ජනතාවගේ ආකල්ප හා ප්‍රතිචාරයන් සම්බන්ධ තොරතුරු එක්රැස් කර ඒ පිළිබඳව තීරණ ගන්නන් හා ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීමට අපේක්ෂා කෙරිනි.

ආදර්ශ ගම්මාන බිහිකිරීම තුළින් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රායෝගික ලෙස යොමු වූ මෙම වැඩසටහනෙහි මූලික අංගය දෙස බලන විට එහි දිගු කාලීන මෙන්ම කෙටිකාලීන අපේක්ෂාවන් ද ගැබ්ව පවතී. ඒවා නම් :

### 1.3.1 දිගු කාලීන බලාපොරොත්තු (අභිමතාර්ථ)

I. තිරසාර වූ නිෂ්පාදන ක්‍රියාවලියක් පදනම් කරගත් ආදර්ශ ගම්මාන බිහි කිරීම.

II. ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීම.

### 1.3.2 කෙටි කාලීන බලාපොරොත්තු (අරමුණු)

I. ජනතාවගේ ආදායම් වර්ධනය කිරීම.

II. රැකියා වර්ධනය කිරීම

III. නිෂ්පාදන ඵලදායීතාව වර්ධනය කිරීම

IV. ආහාර සුරක්ෂිත භාවය තහවුරු කිරීම

V. සංවර්ධනය සඳහා ජනතා සහභාගීත්වය උපරිම අයුරින් යොදා ගැනීම.

## 1.4 උපාය මාර්ග

ඉහත දැක්වූ අභිමතාර්ථ හා අරමුණු සඵල කර ගැනීම සඳහා විවිධ වූ ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට බලාපොරොත්තු වූ අතර ඒවා පහත සඳහන් වේ.

i. නිෂ්පාදන පිරිවැය අඩුකිරීම

ගොවිපල නිෂ්පාදනයන්හි ආර්ථික ඵලදායීබව හා පවුලේ ආදායම් වර්ධනය සමග කෙළින්ම සම්බන්ධ වීම. මේ යටතේ ගොම, පිදුරු, හා කොම්පෝස්ට් වැනි කාබනික ද්‍රව්‍ය භාවිතයට උනන්දු කරවීම මඟින් රසායනික පොහොර භාවිතය අවම කිරීම හා එකවර වගා කිරීමට සැලැස්වීමෙන් ඒකාබද්ධ පළිබෝධ පාලනයට මග සලස්වා රසායන ද්‍රව්‍ය භාවිතය සඳහා යන වියදම අවම කරවීම. අවශ්‍ය බීජ තම ගොවිපල හෝ ගම තුළින්ම නිපදවා ගැනීමට සලස්වා ඒ සඳහා යන අධික වියදම අඩු කිරීම යනාදිය ගැනේ.

ii. නිෂ්පාදන සඳහා වඩා ඉහළ මිලක් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.

වෙළඳපොලෙහි වැඩි ඉල්ලුමක් ඇති බෝග හා කාබනික නිෂ්පාදනවලට උනන්දු කරවීම, වගා කාල සටහන වෙනස් කරවීම මඟින් වැඩි මිලක් ලබා ගත හැකි අවස්ථාවලදී නිෂ්පාදන වෙළඳපොළට දැමීමට කටයුතු සැලැස්වීම, වැඩි මිලක් ලැබෙන තෙක් අස්වනු ගබඩා කිරීම සඳහා උනන්දු කරවීම, ගොවීන් සංවිධානය කරවීම මඟින් ඔවුන්ගේ කේවල් කිරීමේ ශක්තිය වර්ධනය කරවීම හා ඉදිරි වෙළඳ ගිවිසුම් අත්සන් කරවීමට සැලැස්වීම මඟින් වඩාත් හොඳ මිලක් ලබා ගැනීම තහවුරු කරවීම යනාදි කාර්යයන් මෙයට ඇතුළත්ය.

iii. නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම

නිෂ්පාදන ඵලදායීතාව වැඩි කිරීම සඳහා ඉවහල් වන නව බීජ, යෙදවුම්, හා භාවිතයන් මෙන්ම නව යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීම සහ උචිත භාවය අනුව ඒවා යොදා ගැනීමට ගොවීන් උනන්දු කරවීම මේ යටතට ඇතුළත්ය.

iv. සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතය

ගොවිපල මට්ටමේ ඵලදායීතාව හා ආදායම නැංවීමට හේතු කරවන බෝග විවිධාංගීකරණය මෙන්ම යටි වගාව, මිශ්‍ර වගාව යනාදිය සඳහා ගොවීන්

උනන්දු කරවීම, බෝග වගාව හා සත්ව පාලනය එකාබද්ධ කිරීමට මග සැලැස්වීම හා දැනට භාවිතයට නොගත් ඉඩම්, ජලය ඇතුළු ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට යොදා ගැන්මට සැලැස්වීම මේ යටතේ ගැනේ.

v. නිෂ්පාදන නීවුතාවය වැඩි කිරීම

ජල කළමණාකරණය කෙරෙහි ගොවීන් උනන්දු කරවීම හා විසිදුම් හා බිංදු ජල සම්පාදනය වැනි සූක්ෂම ජල සම්පාදන ක්‍රම හඳුන්වා දීම මගින් ජලය ඉතිරි කර ගැනීමට සලස්වා අමතර කන්නයක් වගා කිරීමට මග පෙන්වාදීම මේ යටතට ගැනෙන අතර කාර්යක්ෂම ලෙස සම්පත් භාවිතයට මෙන්ම ආදායම් වර්ධනයටත් මේවා හේතු වේ.

vi. කෘෂි කර්මාන්ත මෙන්ම වෙනත් කර්මාන්ත හා ස්වයං රැකියා බිහි කිරීම.

සංවර්ධනයේ විවිධාංගීකරණයට මෙන්ම ගොවි පවුල්වල රැකියා හා ආදායම් වර්ධනයට ඉවහල් වන මේ සඳහා කෘෂි සම්පත් මෙන්ම වෙනත් වටපිටාවේ ඇති සම්පත් භාවිතයෙන් ඇරඹිය හැකි කර්මාන්ත සහ වෙනත් ආදායම් මාර්ග ඇරඹීමට කැමති අයට අදාළ පුහුණු අවස්ථා ලබාදීම හා අවශ්‍ය පහසුකම්, උපදෙස්, අලෙවි මාර්ග යනාදිය ලබා ගැනීමට අදාළ ආයතන සමග සාකච්ඡා කර මග සැලැස්වීම ඇතුළත්ය.

vii. අරපරෙස්සම, ඉතුරුම් වර්ධනය හා ආයෝජනය සඳහා ජනතාව පෙළඹවීම

ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් බීමත්කම ආදී අනවශ්‍ය වියදම් අඩු කිරීමත් සමෘද්ධි, ගොවිජන බැංකු, ග්‍රාමීය බැංකු ආදී බැංකු සමග වැඩි සබඳතාවක් ගොඩනංවාලීම තුළින් ඉතිරි කිරීම් සඳහා මෙන්ම ණය ආපසු ගෙවීම සඳහා ඔවුන් තුළ නැඹුරුවක් ඇති කිරීමත් එමගින් පහසුවෙන් ණය ලබා ගත හැකි අය බවටත්, අනාගත ආයෝජකයින් බවටත් පත් වීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම

viii. පුනරුත්තාපන හා ඉදිකිරීම් කටයුතු සිදු කිරීම

ආර්ථික හා සමාජ සංවර්ධනය ඇති කිරීමට හේතු වන්නා වූ කැඩී බිඳී ගිය හා ගොඩ වූ වැව්, අමුණු හා ඇල වේලි පුනරුත්ථාපනය, මාර්ග අළුත්වැඩියා

කිරීම යනාදියත් කෘෂි ළිං, ඇළ මාර්ග, පාලම්, බෝක්කු හා ගොඩනැගිලි යනාදිය අළුතෙන් ඉදිකිරීමත් මේ යටතට ගැනේ.

ix. පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීම

කෘෂි ඉඩම්වල පස සංරක්ෂණ සඳහා කානු, වැටි ආදිය දැමීමට සැලැස්වීම, වැව් හා ජලාශයන්ට අදාල ජලාධාර ප්‍රදේශ හා රක්ෂිතයන් හි වන වගා සඳහා උනන්දු කරවීම, පාරවල් දෙපස හා පොදු ඉඩම් යනාදියේ වන වගා කරවීම හා පෞද්ගලික ඉඩම්වල කෘෂි වන වගාවන් සඳහා උනන්දු කරවීම, ඊට අවශ්‍ය පහසුකම් සැලැස්වීම යනාදිය මේ යටතේ සිදු කෙරෙන අතර පස මෙන්ම ජල සංරක්ෂණය කෙරෙහිත් කෘෂි නිෂ්පාදනයන්හි තිරසාරත්වය කෙරෙහිත් මේවා බලපානු ලැබේ..

x සහභාගීත්ව විධික්‍රම අනුගමනය ග්‍රාමීය සංවිධාන බිහි කිරීම

සම්පත් හා ගැටළු හඳුනා ගැනීමේ සිට ඒවාට විසඳුම් ලබා ගැනීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය, පසු විපරම ආදී වූ සංවර්ධනයේ හැම අවස්ථාවකදීම ග්‍රාමීය ජනතාවගේ උපරිම දායකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය සංවිධාන ව්‍යුහයන් ගම තුළ බිහි කිරීම, සංවර්ධන කටයුතු හා සම්බන්ධ තීරණ ගැනීමේදී ජනතාව සම්බන්ධ කර ගැනීම හා ඔවුන්ගේ ගැටළු යනාදිය හඳුනා ගැනීම සඳහා සහභාගීත්ව ගැමි විමසුම් ක්‍රමය වැනි සහභාගීත්ව විධි ක්‍රමයන් අනුගමනය කිරීම.

xi ප්‍රදේශයේ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන ගම වෙත වඩාත් සමීප කරවීම

කෘෂි උපදෙස් ඇතුළු සෙසු තාක්ෂණ හා විවිධ සේවාවන් සපයනු ලබන ග්‍රාමීය ආයතන ගමත් සමග වඩාත් සමීප කරවීම හා ඒ සඳහා ගම තුළ පිහිටුවන ආයතනික රාමුව උපයෝගී කර ගැනීමට කටයුතු කිරීම.

xii නව අත්හදා බැලීම් සිදු කිරීම

වෙනත් ප්‍රදේශවලින් දැක ගත හැකි සාර්ථක සංවර්ධන අත්දැකීම් පදනම් කර ගනිමින් විවිධ නිෂ්පාදන, යෙදවුම්, තාක්ෂණික භාවිතයන්, සංවිධානාත්මක හා කළමනාකරණ විධි ක්‍රමයන් පිළිබඳ අත්හදා බැලීම් සිදු කිරීම.

## 1.5 ක්‍රියා මාර්ග

ඉහත සඳහන් කරනු ලැබූ විවිධ සංවර්ධන ක්‍රමෝපායන් යටතේ ගනු ලබන ක්‍රියා මාර්ග අදාල ව්‍යාපෘති ප්‍රදේශයන්හි පවත්නා ප්‍රශ්නවල ස්වභාවය හා සම්පත් යනාදිය අනුවත් ඒවායෙහි ඇති උචිත භාවය මෙන්ම ඒ සඳහා ජනතාව දක්වනු ලබන උවමනාව හා ප්‍රමුඛත්වය මගින් තීරණය කෙරේ.

## 1.6 යෙදවුම්

මෙම ව්‍යාපෘතිය සඳහා භාවිත මූලික යෙදවුම් වන්නේ නව බීජ වර්ග, පැල වර්ග, සතුන් වර්ග, තාක්ෂණික උපකරණ, ව්‍යාප්ති සේවා දැනුම හා උපදේශන සේවා, විශේෂඥ ඥානය, මුදල් යනාදිය වෙති.

මේවා බොහොමයක් එම ගම් ප්‍රදේශයන්හි අදාළ ආයතන මගින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් යටතේ ලබාදෙනු ලබන ඒවා වන අතර ව්‍යාපෘතිය යටතේ ඒවා ජනතාව වෙත ක්‍රමවත් හා වඩාත් ඵලදායී වන ආකාරයෙන් බෙදා හැරීමට කටයුතු සැලසේ. ඊට අමතරව ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති මුදල් මගින්ද බීජ හා පැල වර්ග යම්කිසි ප්‍රමාණයක් ජනතාව වෙත ලබා දීමට කටයුතු කෙරේ.

## 1.7 නිමවුම්

වැඩසටහනින් අපේක්ෂිත නිමවුම් වන්නේ විවිධ වගාවන් යටතේ ඇති වපසරිය හා යටි වගාව, මිශ්‍ර වගාව හා නව තාක්ෂණික ක්‍රම භාවිත වපසරිය වැඩිවීම, ස්වයං රැකියා ඒකක වැඩිවීම, නිෂ්පාදනය වැඩිවීම යනාදියයි.

## 1.8 සම්බන්ධීකරණය

මෙම අධ්‍යයනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සම්බන්ධීකරණය කරනු ලබන අතර කෘෂිකර්ම හා පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍යාංශය මෙන්ම සෙසු අමාත්‍යාංශවලට අයත් දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අදාළ ප්‍රදේශවල පිහිටි රාජ්‍ය නොවන ආයතන වල සහයෝගයෙන් ක්‍රියාත්මක කෙරේ.

## 1.9 මූල්‍ය පහසුකම් සැපයීම

වැඩසටහන සම්බන්ධීකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සිදු කරනු ලබන්නේ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අයත් සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල මගිනි. මේ සඳහා රු. දශ ලක්ෂ 4.3 ක මුදලක් ලබා දී තිබේ.

මීට අමතරව ඇතැම් ගම්වල ඉදිකිරීම් කටයුතු සඳහා ද එමගින් මුදල වැයකර ඇත. එම ප්‍රමාණය රු.දශ ලක්ෂ 0.7 කි. මීට අමතරව කෘෂි කර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය රු. දශ ලක්ෂ 10 ක මුදලක් වැව් හා ප්‍රවාහන පද්ධතීන් පුනරුත්ථාපනය හා කෘෂි ළිං ඉදිකිරීම ඇතුළත් පාදක ව්‍යුහය දියුණු කිරීමට ලබාදී ඇත.

## 1.10 ව්‍යාපෘති ප්‍රදේශ තෝරා ගැනීම

ව්‍යාපෘති ප්‍රදේශ තෝරා ගැනීමේදී විවිධ කෘෂි දේශගුණික කලාපයන් මෙන්ම ( වී, අර්තාපල්, ලොකු ළූණු, රතු ළූණු, මිරිස්, උඩරට එළවළු, මුං ඇට/කව්පි වැනි) විවිධ බෝග හා (සත්ව පාලනය වැනි) ආර්ථික කටයුතු නියෝජනය වන ආකාරයට කටයුතු කර ඇත. ඒ අනුව (උතුරු මැද, ඌව, මධ්‍යම, වයඹ ආදී) පළාත් 4 ක (පොළොන්නරුව, මොණරාගල, බදුල්ල, කුරුණෑගල, මාතලේ, අනුරාධපුරය, නුවරඑළිය, පුත්තලම යනාදී) දිස්ත්‍රික්ක 8 ක් නියෝජනය වන ආකාරයෙන් ග්‍රාම සේවා වසම් 9 ක් තෝරා ගෙන ඇත. එසේ තෝරාගත් ගම් හා අදාල විස්තර ඇමුණුම 1හි අංක 1 වගුවෙහි සඳහන් වේ.

## 1.11 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ආයතනයේ කාර්යභාරය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2002 වසරේ අවසාන කාර්තුව තුළත් 2003 වසර මුළුල්ලේත් හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සම්පූර්ණ ශක්තිය හා කැපවීම සිදුකර ඇත. මේ වෙනුවෙන් ආයතනයේ සියළුම අංශයන්හි සිටින පර්යේෂණ නිලධාරීන් මෙන්ම පර්යේෂණ සහාය කාර්ය මණ්ඩලයත් මහත් පරිශ්‍රමයක් දරා ඇත. ඒ අනුව ඒ ඒ ව්‍යාපෘති ගම්මාන යටතේ ඇති සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා (සම්බන්ධීකරණ නිලධාරියකු/නිලධාරිනියක ලෙස) පර්යේෂණ නිලධාරියකු/නිලධාරිනියක බැගින් පත්කර ඇත. ඔහුගේ හෝ ඇයගේ සහයට තවත් පර්යේෂකයකු පත්කර සිටී. මීට අමතරව ඒ ඒ ව්‍යාපෘති ගම්වල සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා සහාය වීමට සංඛ්‍යාන නිලධාරී හා සංඛ්‍යාන සහකාරවරුන් එක් අයකු හෝ දෙදෙනකු පත්කර සිටිති. සියළුම ගම්මාන හෙවත් උප ව්‍යාපෘතීන් ඇතුලත් මුළු වැඩසටහනම සම්බන්ධීකරණය කිරීම කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයෙන් සිදු කරනු ලබන අතර ඒ සඳහා එක් සම්බන්ධීකරණ නිලධාරියකු පත්කර සිටී. ආයතනයේ අධ්‍යක්ෂතුමා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා උපදෙස් සැපයීමෙන් එය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වති. මෙම ව්‍යාපෘතිය හා ඒ යටතේ ඇති උප ව්‍යාපෘතීන් (ව්‍යාපෘති ගම්) සම්බන්ධයෙන් විවිධ වගකීම් දරනු ලබන නිලධාරීන් / නිලධාරිනියන්ගේ නම් ඇමුණුම 1 යටතේ ඇති අංක 2 වගුව මගින් ඉදිරිපත් කර ඇත.

## 1.12 මෙම ඇගයීම් අධ්‍යයන වාර්තාව

මෙම වාර්තාවෙන් හෙළිදැක්වෙන්නේ තිරසර වැඩසටහනෙහි එක් ව්‍යාපෘති ප්‍රදේශයක් වූ මොණරාගල දිස්ත්‍රික්කයේ නිකවැව ග්‍රාම නිලධාරී වසම පදනම් කරගනිමින් ක්‍රියාත්මක කල වැඩසටහන ඇගයුමට භාජනය කිරීම තුළින් ලබාගත් තොරතුරුය. අදාළ ව්‍යාපෘති ප්‍රදේශයේ මූලික සමාජ ආර්ථික ලක්ෂණ, සම්පත්, ප්‍රශ්න



පුස්තකාලය
LIBRARY
MAR 11

හා ගැටළු යනාදියත්, ව්‍යාපෘතිය යටතේ එහි ක්‍රියාත්මක කරන ලද කටයුතුවල ඒවායේ ප්‍රතිඵල හා අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු කරා ලඟාවීම සඳහා ඒවා කොතරම් දුරට උපකාරී වුවාද යන්නත්, ව්‍යාපෘතියට මුහුණ දීමට සිදු වු ගැටළු යනාදියත්, එය ක්‍රියාත්මක කිරීමෙන් ලබාගත් පාඩම් හා අත්දැකීම් යනාදියත් මෙමගින් ඉදිරිපත් කෙරේ.

## 1.13 ක්‍රමවේදය

මෙම වාර්තාව සැකසීමේදී අදාල ව්‍යාපෘති ප්‍රදේශය පදනම් කර ගනිමින් සකසා ඇති පාදක සමීක්ෂණ වාර්තාව, එහි වාසය කරන ජනතාව සම්බන්ධ කර ගනිමින් සිදු කරනු ලැබු සහභාගීත්වය ගැමි විමසුම් අභ්‍යාසය, ගම වෙත ඒ ඒ අවස්ථාවන්හිදී පිවිසීමේදී කරනු ලැබු නිරීක්ෂණ ව්‍යාපෘතියට විවිධ අත්දැකිම් පදනම් කර ගනිමින් වරින් වර සකස් කරනු ලැබු ප්‍රගති වාර්තා යනාදිය පදනම් කරගනු ලැබිනි.

දෙවන පරිච්ඡේදය.

නිකවැව ග්‍රාමනිලධාරී වසමෙහි සමාජ ආර්ථික ලක්ෂණ.

2.1 පිහිටීම :-

නිකවැව ග්‍රාමනිලධාරී වසම මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රා.ලේ. කොට්ඨාශය හා ගොවිජන සේවා බලප්‍රදේශය තුළ පිහිටා ඇත. උතුරු දෙසින් වැල්ලවාය ප්‍රා.ලේ. කොට්ඨාශ මායිමද දකුණින් සූරියවැව හා ලුණුගම්වෙහෙර ප්‍රා.ලේ. කොට්ඨාශ මායිම්ද නැගෙනහිරින් හා බටහිරින් පිළිවෙළින් බෝදාගම හා උස්ගල ග්‍රා.නි. මායිම්ද මෙහි සීමාවන්ය. නිකවැව, නිකාර හා වීරපුරගම යන ගම්මාන ත්‍රිත්වයෙන් නිකවැව ග්‍රාමනිලධාරී වසම සමන්විත වේ. තණමල්විල සිට උඩවලව හරහා කොළඹ දෙසට ගමන් කරන මාර්ගය ගම තුළින් දිවෙන ප්‍රධානතම මාර්ගය වන අතර බෝදාගම මංසන්ධියෙන් හැරී හම්බෙගමුව මාර්ගය ඔස්සේද නිකවැව ග්‍රාමයට පිවිසිය හැකිය.

2.2 ඓතිහාසික තත්ත්වය :-

ගමෙහි ඓතිහාසික තත්ත්වය පිළිබඳව විමසීමේදී එහි ජනාවාස ආරම්භ වූ කාලවකවානුව කෙතරම් ඈතට දිවයන්නේදැයි නිශ්චිත තොරතුරු ලබාගත නොහැක. පවත්නා දත්තයන්ට අනුව මෙම ගම්මානය පාරම්පරික ජන කණ්ඩායමකින් සමන්විත වූවක් බව පෙනේ. ඊට අමතරව අවශේෂ ප්‍රදේශ වලින්ද කෘෂිකර්මය මුල්කරගෙන සංක්‍රමණ සිදුවී ඇත. ඊට නිදසුන් ලෙස හම්බන්තොට හා මාතර දිස්ත්‍රික්කයන්හි විවිධ ප්‍රදේශවලින් වරින් වර ගම වෙත පැමිණ සිටින පාරම්පරික පදිංචිකරුවන් පෙන්වාදිය හැකිය.

2.3 ජනගහනය හා එහි ලක්ෂණ :-

නිකවැව වසමෙහි ග්‍රාමනිලධාරී කාර්යාලයෙන් ලබාගත් දත්තයන්ට අනුව වසම තුළ පවුල් 225 ක් ජීවත්වෙති. සමස්ත ජනගහනය පුද්ගලයින් 967 කි. ඉන් 444 ක් නිකවැව ගම්මානයේද පිළිවෙලින් 410 ක් හා 113 ක් වීරපුර හා නිකාර ගම්මානයන්හිද පදිංචිව සිටිති. වසමෙහි ස්ත්‍රී ජනගහනය 468 ක් වන අතර පිරිමි ජනගහනය 499 කි. මේ අනුව වසමෙහි පුම්ස්ත්‍රී අනුපාතය 106.6*කි. එය 2001 ජන සංගණනයෙන් හෙළිවන ජාතික මට්ටමේ අගය වන 97.7 ඒකක 8.9 කින් ඉක්මවා යාමකි. අප සමීක්ෂණයෙන් හෙළිවූ පරිදි මේ සඳහා බලපා ඇති එක් හේතුවක් වන්නේ නිකවැව වසමෙන් පිට පවත්නා වූ අවශේෂ ප්‍රදේශවලින් කෘෂිකර්මය මත පදනම්ව පිරිමි සංක්‍රමණ ගමවෙත සිදුවීමයි. බොහෝවිට ඔවුන්ගේ අඹුදරුවෝ වෙනත් ප්‍රදේශවල ජීවත් වෙති.

---

- ස්ත්‍රීන් 100 කට සිටින පිරිමි සංඛ්‍යාව.

2.1 සංඛ්‍යා සටහන.

සාමාජික සංඛ්‍යාව අනුව පවුල් ව්‍යාප්තිය (නිකවැව වසම).

| සාමාජික සංඛ්‍යාව | නිකවැව | | නිකාර | | වීරපුර ගම | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0-2 | 12 | 13.2 | 4 | 17.4 | 10 | 12.0 | 26 | 13.2 |
| 3-6 | 75 | 82.4 | 19 | 82.6 | 63 | 75.9 | 157 | 79.7 |
| 7-9 | 3 | 3.3 | 0 | 0.0 | 9 | 10.8 | 12 | 6.1 |
| 9< | 1 | 1.1 | 0 | 0.0 | 1 | 1.2 | 2 | 1.0 |
| එකතුව | 91 | 100.0 | 23 | 100.0 | 83 | 100.0 | 197 | 100.0 |

*මූලය : පාදක සමීක්ෂණය -2003.*

2.1 සංඛ්‍යා සටහන මගින් සමීක්ෂණයට ලක්කළ පවුල්වල පුද්ගල සංඛ්‍යාව අනුව ඒවායේ ව්‍යාප්තිය පෙන්නුම් කෙරෙයි. වසමෙහි පවුලක සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව 04 කි. කෙසේ නමුත් පවුල් අතරින් වැඩිම ප්‍රතිශතයක් නියෝජනය වන්නේ සාමාජික සංඛ්‍යාව 03-06 දක්වා සිටින පවුල්ය. එය මුළු පවුල් සංඛ්‍යාවෙන් 79.7% කි. මෙය වියළි කලාපීය කෘෂිකාර්මික ප්‍රදේශයක් වන බැවින් පවුලක සාමාජික සංඛ්‍යාව වැඩිවීම එදිනෙදා ගොවිතැන් කටයුතු කරගැනීමට පහසුවක් ලෙස සළකයි. සාමාජික සංඛ්‍යාව 6 ට වැඩි පවුල් ඇත්තේ 7% ක පමණ ප්‍රතිශතයකි.

නිකවැව ග්‍රාමනිලධාරී වසමෙහි ජනගහනයෙහි වයස් ව්‍යුහය පිළිබඳව විමසීමේදී එහි විශේෂ ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. 2.2 සංඛ්‍යා සටහන මගින් ජනගහනය ස්ත්‍රී පුරුෂ භාවය හා වයස් ව්‍යුහය අනුව ව්‍යාප්තවී ඇති අයුරු පෙන්වයි. මේ අනුව සමීක්ෂණයට ලක්වූ පුද්ගලයින් 822 අතුරින් 11% ක ප්‍රතිශතයක් වයස අවු. 5 හා ඊට අඩු කාණ්ඩය නියෝජනය කරයි. මේ අනුව ජනගහන පිරමීඩයෙහි පතුළ පටු වීමක් හඳුනාගත හැකිය. මේ සඳහා සෞඛ්‍ය හා පවුල් සැළසුම් ක්‍රම ප්‍රචලිත වීම හේතු වී ඇත. වයස අවු. 14-60 අතර පිරිස සක්‍රිය නැතහොත් වැඩකළහැකි වයසේ ජනගහනය ලෙස සැළකුවහොත් වසම තුළ එහි ප්‍රතිශතය වසමෙහි සමස්ත ජනගහනයෙන් 67.28% කි. මේ අනුව ආර්ථිකමය වශයෙන් ඉහළ ඵලදායිතාවක් ලැබියහැකි ජන කොටසක් ගමතුළ සිටින බව පෙනේ. වයස් ව්‍යුහය අනුව අවුරුදු 60 ඉක්මවූ ජනගහනයේ ප්‍රතිශතය සියයට 3 ක් පමණ වේ. මේ අනුව අවු. 14 ට අඩු හා 60 ට වැඩි පිරිස යැපෙන්නන් ලෙස සැළකුවහොත් වසමෙහි යැපුම් අනුපාතය සියයට 34 ක් පමණ වේ.

නිකවැව වසමෙහි වෙසෙන සියළුදෙනා සිංහල ජාතියට අයත්වන අතර සියල්ලෝම බෞද්ධයෝ වෙති.

2.2 සංඛ්‍යා සටහන.

වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහන ව්‍යාප්තිය (නිකවැව වසම).

| වයස් කාණ්ඩය | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| <=5 | 42 | 10.0 | 47 | 11.6 | 89 | 10.8 |
| 5<=14 | 67 | 16.0 | 71 | 17.6 | 138 | 16.8 |
| 14<=30 | 144 | 34.4 | 133 | 32.9 | 277 | 33.7 |
| 30<=60 | 142 | 34.0 | 134 | 33.2 | 276 | 33.6 |
| 60<=75 | 16 | 3.8 | 11 | 2.7 | 27 | 3.3 |
| 75< | 7 | 1.7 | 8 | 2.0 | 15 | 1.8 |
| එකතුව | 418 | 100.0 | 404 | 100.0 | 822 | 100 |

*මූලය- පාදක සමීක්ෂණය -2003*

## 2.4 ප්‍රධාන ආර්ථික කටයුතු :-

නිකවැව ග්‍රාමනිලධාරී වසම ප්‍රධාන ලෙසම වියළි කලාපයට අයත් කෘෂිකාර්මික ප්‍රදේශයකි. මේ අනුව මෙහි ප්‍රධානතම ආදායම් උත්පාදන මාර්ගය කෘෂිකර්මයයි. ඒ අතරින් හේන් ගොවිතැන කැපී පෙනෙයි. ඊට අමතරව සුළු වාරිමාර්ග යටතේ කුඩා වැව් ආශ්‍රිතව මහ කන්නයේ වී ගොවිතැනත් යල කන්නයේ සුළු වශයෙන් අතිරේක භෝග වගාවත් ප්‍රදේශයේ ඇති කැළෑ බිම් උපයෝගී කර ගනිමින් කිරි සහ මස් සඳහා හරකුන් ඇති කිරීම පදනම් කරගත් සත්ත්ව පාලනයත් සිදුවේ. 2.3 සංඛ්‍යාන සටහනෙන් පෙන්වන පරිදි වසම තුළ රැකියා නියුක්ත සමස්ත ප්‍රමාණය වන 377 ක්වූ පිරිසෙන් 53% ක පිරිසක් ගොවි කාරකයින් වේ. මෙහිදී ගොවිකාරකයින් ලෙස අර්ථදක්වා ඇත්තේ කෘෂිකර්ම හා සත්ත්ව පාලන කටයුතු පිළිබඳව වගකීම දරන්නන්ය. ඊට අමතරව ගොවිපළ උදව්කරුවන් ලෙස 23% හඳුනාගත හැකිය. මේ අතරින් 80% කාන්තාවන්ය. සාමූහිකත්වය මත පදනම් වූ ගොවිතැන් ක්‍රම මත පදනම්වීම තුළ නිවසේ කාන්තාවද තම මූලික කාර්යයක් ලෙස ගොවිපළ උදව්කරුවන් ලෙස ක්‍රියාකරන බව පෙනේ. මේ අනුව සමස්තයක් ලෙස ගොවිකාරක හා ගොවිපල උදව්කරුවන් වශයෙන් කෘෂිකර්මය මූලික කරගනිමින් ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාවලියෙහි නිරතවන පිරිස වසමෙහි සමස්ත සේවා නියුක්ත පිරිසෙන් සියයට 76 කි.

මෙවැනි විශාල පිරිසක් කෘෂිකර්මය මතම පදනම්වීමට මූලික ලෙසම හේතුවී ඇත්තේ වෙනත් ආදායම් මාර්ග ප්‍රදේශය තුළ දුර්ලභ වීමයි. වසම තුළ රජයේ රැකියාවල නියුක්ත පිරිස සමස්ත සේවා නියුක්ත පිරිසෙන් 6% කි. විශේෂයෙන්ම ප්‍රදේශයේ ජනතාවගේ අධ්‍යාපන මට්ටම එතරම් ඉහළ මට්ටමක නොපවතින බැවින් හා උසස් අධ්‍යාපනය වෙත යොමුවී ඇති පිරිස ඉතා අල්ප වීම තුළ රජයේ රැකියා වෙත යොමුවන ප්‍රමාණය පහළ මට්ටමක පවතින බව පෙනේ.

පෞද්ගලික අංශයේ රැකියා නියුක්තියද සමස්ත රැකියා නියුක්ත පිරිසෙන් 06% ක ප්‍රතිශතයක් ගන්නා අතර එයටද ඉහත හේතු සාධක බලපා ඇත. පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු පිරිසෙන් බහුතරය කාන්තාවන් වේ. එය 67% ක ප්‍රතිශතයකි. විශේෂයෙන්ම ගම්මානයෙන් පිටත ඇගළුම් කර්මාන්ත ආදියෙහි රැකියාවල නියුතු කාන්තාවන් මේ තුළ අන්තර්ගත වේ. කෙසේ නමුත් පෞද්ගලික අංශයේ ඉහළ තලයේ සේවා නියුක්තියකයන් ගම තුළින් හඳුනාගත නොහැක. පෞද්ගලික ආරක්ෂක සේවා, කර්මාන්ත කම්කරුවන්, සේවකයන් ආදී රැකියා අවස්ථාවල ඔවුන් නිරතවන අතර රැකියා අවස්ථා සඳහා ගම්මානයෙන් බැහැර වී ඇත.


## 2.3 සංඛ්‍යා සටහන.

පවුලේ සාමාජිකයන් නිරතවන ප්‍රධාන රැකියාවන් (නිකවැව වයම)

| රැකියාවේ ස්වභාවය | පිරිමි | | ගැහැණු | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ගොවිකාරක | 172 | 70.5 | 27 | 20.5 | 199 | 52.8 |
| ගොවිපල උදව්කරු | 17 | 7.0 | 70 | 53.0 | 87 | 23.1 |
| රජයේ රැකියා | 16 | 6.6 | 7 | 5.3 | 23 | 6.1 |
| පෞද්ගලික අංශයේ රැකියා | 8 | 3.3 | 16 | 12.1 | 24 | 6.4 |
| ස්වයං රැකියා | 10 | 4.1 | 8 | 6.1 | 18 | 4.8 |
| පුහුණු ශ්‍රමික | 13 | 5.3 | 0 | 0.0 | 13 | 3.4 |
| කෘෂිකාර්මික කම්කරු | 3 | 1.2 | 0 | 0.0 | 3 | 0.8 |
| කෘෂිකාර්මික නොවන කම්කරු | 3 | 1.2 | 1 | 0.8 | 4 | 1.0 |
| විදේශ රැකියා | 1 | 0.4 | 0 | 0.0 | 1 | 0.3 |
| වෙනත් | 2 | 0.4 | 3 | 2.3 | 5 | 1.3 |
| එකතුව | 245 | 100.0 | 132 | 100.0 | 377 | 100 |

*මූලය : පාදක සමීක්ෂණය - 2003.*

2.1 රූප සටහන
පවුලේ සාමාජිකයන් නිරත වන ප්‍රධාන රැකියාවන් (නිකවැව වසම).




ස්වයං රැකියා කටයුතු සඳහා වැඩි නැඹුරුවක් පවතින්නේ, වීරපුර ගම්මානය තුළයි. විශේෂයෙන්ම මෙම ප්‍රදේශයේ උඩවලව - කොළඹ මහාමාර්ගය දෙපස තාවකාලික වෙළඳසැල් (එළවළු හා පළතුරු) පවත්වාගෙන යමින් ආදායම් උත්පාදනයෙහි නිරත පිරිසක් හඳුනාගත හැකිය. ප්‍රදේශයේ බහුල කෘෂිකාර්මික නිෂ්පාදන තම අලෙවිසැල්වල තබා දේශීය සංචාරකයින්ට හා වන්දනාකරුවන් වෙත අලෙවිකිරීම ඔවුන්ගේ මූලික කාර්යයකි. එවැනි ස්වයං රැකියා මාර්ගවලින් යැපෙන පිරිස සමස්ත රැකියා නියුක්ත පිරිසෙන් 5% තරම් ප්‍රතිශතයකි. මේ තුළට රසකැවිලි නිෂ්පාදන, ඇඳුම් මැසීම් ආදියෙහි නිරතවූවන්ද අන්තර්ගතය.

පුහුණු ශ්‍රමිකයන් වශයෙන් ගැනෙන වඩු කර්මාන්තය, පෙදරේරු ශිල්පය, කම්මල් වැඩ වැනි වෘත්තීන්හි යෙදෙන පිරිසෙහි ප්‍රතිශතය සමස්ත සේවා නියුක්ත පිරිසෙන් 3% තරම් ඉතා පහළ අගයක් ගෙන තිබේ. ඊට අමතරව කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන අංශයේ කම්කරුවන් ප්‍රතිශතයද ඉතා පහළ මට්ටමක පවතී. විශේෂයෙන්ම තමාගේම කෘෂිකාර්මික කටයුතුවල යෙදීමේ හැකියාව තිබෙන බැවින් කුළී ශ්‍රමය සැපයීමේ දැඩි අවශ්‍යතාවක් ප්‍රදේශයේ ජනතාවට නොමැත. එබැවින් මෙවැනි අංශ වෙත යොමුවෙන ප්‍රමාණය ඉතා පහළ අගයක් ගෙන තිබේ. විදේශ රැකියා සඳහා යොමුවී ඇති බවට වාර්තාවූයේ මුළු ගම්මානයෙන්ම එක් අයෙකු පමණි.



21455

2.4 සංඛ්‍යා සටහන.

පවුල් සාමාජිකයන් නිරතවන ද්විතීයික රැකියාවන් (නිකවැව වයම).

| රැකියාව | එකතුව | | | |
|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ගොවි කාරක | 7 | 21.2 | 0 | 0.0 |
| ගොවිපල උදව්කරු | 2 | 6.1 | 1 | 14.3 |
| රජයේ රැකියා | 0 | 0.0 | 0 | 0.0 |
| පෞද්ගලික අංශයේ රැකියා | 0 | 0.0 | 0 | 0.0 |
| ස්වයං රැකියා | 8 | 24.2 | 5 | 71.4 |
| පුහුණු ශ්‍රමික | 2 | 6.1 | 0 | 0.0 |
| කෘෂිකාර්මික කම්කරු | 9 | 27.3 | 1 | 14.3 |
| කෘෂිකාර්මික නොවන කම්කරු | 4 | 12.1 | 0 | 0.0 |
| විදේශ රැකියා | 0 | 0.0 | 0 | 0.0 |
| වෙනත් | 1 | 3.0 | 0 | 0.0 |
| එකතුව | 33 | 100.0 | 7 | 100.0 |

*මූලය : පාදක සමීක්ෂණය - 2003*

ඉහත දැක්වූ ප්‍රධාන ආදායම් උත්පාදන කටයුතුවලට අමතරව ද්විතීයික ආදායම් උත්පාදන අවස්ථාවල නිරතවන පිරිසක්ද ප්‍රදේශයතුළින් හඳුනාගත හැකිය. එහි ප්‍රතිශතය සමස්ත සේවා නියුක්ත පිරිසෙන් 10.61% කි. ද්විතීයික රැකියාවල නිරතවන පිරිසෙන් වැඩි ප්‍රතිශතය එනම් 32.5% ස්වයං රැකියාවල නිරතවෙයි. ඒ අතරින් වීරපුර ගම්මානයට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. පෙර සඳහන්කළ පරිදිද උඩවලව - කොළඹ ප්‍රධාන මාර්ගය වීරපුර ගම්මානය හරහා වැටීම හේතුවෙන් ගොවිතැනට අමතරව ද්විතීයික ආදායම් උත්පාදන කටයුත්තක් ලෙස කුඩා අලෙවිසැල් පවත්වාගෙන යාම මෙහි බහුලව දක්නට ලැබේ.

## 2.4.2 රැකියා වියුක්තිය.

පාදක සමීක්ෂණයෙන් හෙළිවූ පරිදි නිකවැව ගම්මානය තුළ රැකියා වියුක්තිය එතරම් ප්‍රබල ප්‍රශ්නයක් නොවන බව පෙනේ. විශේෂයෙන්ම ප්‍රදේශයේ සුලභව පිහිටි පුද්ගලික, රාජ්‍ය මෙන්ම දේවාල සන්තක ඉඩම් පදනම් කර ගනිමින් කෘෂිකාර්මික අංශයේ රැකියාවන්හි නියැලීමේ අවස්ථා සුලභ වීම තුළ යම්කිසි ආදායම් උත්පාදන ක්‍රියාවලියක යෙදීමේ අවස්ථා සෑම කෙනෙකුටම ගම තුළින්ම සැලසී ඇත.

2.5 සංඛ්‍යා සටහන

පවුලේ සාමාජිකයන් නිරතවන කාර්යයන්- (නිකවැව වසම)

| කාර්යය | පිරිමි | | ගැහැණු | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| රැකියා නියුක්ත | 245 | 58.6 | 132 | 32.7 |
| රැකියා වියුක්ත (බලාපොරොත්තු වන) | 10 | 2.3 | 16 | 4.0 |
| රැකියා වියුක්ත (බලාපොරොත්තු නොවන) | 2 | 0.5 | 1 | 0.2 |
| ශිෂ්‍යයන් | 94 | 22.4 | 103 | 25.5 |
| විශ්‍රාමික, මහළු, ආබාධිත, ළදරු | 64 | 15.3 | 71 | 17.6 |
| ගෘහණියන් | 0 | 0.0 | 81 | 20.0 |
| වෙනත් | 3 | 0.7 | 0 | 0.0 |
| එකතුව | 418 | 100.0 | 404 | 100.0 |

*මූලය : පාදක සමීක්ෂණය -2003*

නිකවැව ගම්මානයේ රැකියා නියුක්ත, වියුක්ත හා බලාපොරොත්තු නොවන පිරිසෙහි එකතුව පුද්ගලයින් 406 කි. එය සමස්ත ජනගහනයෙන් 49.39% ක ප්‍රතිශතයකි. ජනගහනයෙහි ඉතිරි 50.60% ශිෂ්‍යයින්, ගෘහනියන්, මහළු, දුබල ආබාධිත හා ළමුන් අතර ව්‍යාප්ත වේ. මේ අනුව තර්කානුකූලව ශ්‍රම බලකාය ලෙස සැළකිය හැක්කේ ජනගහනයෙන් 49.39% වූ පිරිසයි. එම පිරිසෙන් 92.86% සේවා නියුක්තිකයන් වේ. 6.4% සේවා වියුක්ත පිරිස වේ. 2002 මහබැංකු වාර්තාවට අනුව ජාතික මට්ටමේ සේවා වියුක්ති අනුපාතය 9.1% කි. මේ අනුව නිකවැව ගම්මානයේ සේවා වියුක්තිය ජාතික මට්ටමේ අගයට වඩා පහළ බව පෙනේ. කෙසේ නමුත් නිකවැව ගම්මානයේද සේවා වියුක්තිය, අ.පො.ස.(සා.පෙ.) මට්ටමට ඉහළ අධ්‍යාපනය ලැබූවන් අතර ඉහළ මට්ටමක් ගන්නාබව සමීක්ෂණය තුළින් හෙළිවිය. වෘත්තීය පුහුණු අධිකාරිය හා වෙනත් ආයතන මගින් විවිධ පුහුණුවීම් ලබා රැකියා අවස්ථා සොයමින් සිටින පිරිස මේ අතර වේ.

## 2.4.3. ඉඩම් අයිතිය, බුක්තිය හා ඉඩම් ආශ්‍රිත ගැටළු :-

පාදක සමීක්ෂණයෙන් හෙළිවූ පරිදි සමීක්ෂණයට ලක්වූ පවුල් 197 විවිධ වූ අයිතීන් යටතේ අක්කර 492.25 ක භූමි ප්‍රමාණයක් පරිහරණය කරයි. මෙයින් වැඩි ප්‍රතිශතයක් එනම් 28.1% ස්වර්ණභූමි, ජයභූමි ඔප්පු සහිත හෝ රජයෙන් බෙදාදී ඇති ඉඩම්ය. විශේෂයෙන්ම ඈත අතීතයේ සිට කැළෑ ඉඩම්ව පැවති මෙම ප්‍රදේශ වෙත කෘෂිකාර්මික කටයුතු සඳහා ජනතාව සංක්‍රමණය වීමත් සමග ඉඩම්වල අයිතිය පිළිබඳ ගැටළු මතුවිය. මෙහිදී විවිධ රජයන් විවිධ කාලවකවානුවල විවිධ වැඩසටහන් යටතේ එම ඉඩම් සඳහා ස්ථිර හිමිකාරිත්වය ලබාදී ඇත. ඊට අමතරව දැනටමත් තාවකාලික බලපත්‍ර යටතේ පරිහරණය කරන රජයේ ඉඩම්වල ප්‍රතිශතය 13.7% කි. අනවසරයෙන්

පරිහරණය කරන රජයේ ඉඩම්වල ප්‍රතිශතය 14.7% කි. විශේෂයෙන්ම හේන්ගොවිතැන සඳහා අනවසරයෙන් රජයේ ඉඩම් හෙළිකිරීම ප්‍රදේශය තුළ දක්නට ලැබේ.

2.6 සංඛ්‍යා සටහන

විවිධ වූ අයිති හා බුක්ති ක්‍රම යටතේ පරිහරණය කරන ඉඩම් ප්‍රමාණයන් හා ප්‍රතිශතයන් (නිකවැව වයම).

| අයිතිය/ බුක්තිය | ප්‍රමාණය | |
|---|---|---|
| | අක්කර | % |
| ස්වර්ණභූමි/ජයභූමි හෝ රජය විසින් බෙදාදුන් ඉඩම් | 138.25 | 28.1 |
| තාවකාලික බලපත්‍රය සහිත රජයේ ඉඩම් | 67.25 | 13.7 |
| අනවසර රජයේ ඉඩම් | 72.25 | 14.7 |
| බලපත්‍ර සහිත දේවාල ඉඩම් | 104.75 | 21.3 |
| බලපත්‍ර රහිත දේවාල ඉඩම් | 51.0 | 10.4 |
| අනවසර පෞද්ගලික ඉඩම් | 11.0 | 2.2 |
| සින්නක්කර ඉඩම් | 41.75 | 8.5 |
| අඳ/බදු/ උකසට | 5.50 | 1.1 |
| වෙනත් | 0.50 | 0.1 |
| එකතුව | 492.25 | 100.0 |

*මූලය : පාදක සමීක්ෂණය -2003*

සටහන : ප්‍රතිචාරීන් හතරදෙනෙකු ඉඩම් නොමැති අය ලෙස වාර්තාවිය.

නිකවැව ගම්මානයේ ඉඩම් පිළිබඳ සැළකීමේදී කැපීපෙනෙන ලක්ෂණයකි කතරගම දේවාලයට අයිති විශාල ඉඩම් ප්‍රමාණයක් වයමතුළ පැවතීම. වයමෙහි ජනතාව පරිහරණය කරන ඉඩම් ප්‍රමාණයෙන් 31.7% දේවාල සන්තක වූ ඒවාය. එය 21.3% අවසරපත්‍ර යටතේද 10.4% අනවසරයෙන්ද වශයෙන් ජන පරිහරණයට ලක්ව ඇත. සින්නක්කර අයිතිය මත පදනම්වූ ඉඩම් ප්‍රතිශතය 8.5% කි. මේවා පරම්පරාගතව පුද්ගලයන්ට හිමිවූ ඉඩම්ය. අඳ, බදු හෝ උකස් පදනම මත පරිහරණය වන ඉඩම් ප්‍රතිශතය 1.1% වන අතර එය එතරම් ඉහළ අගයක් නොවේ. ඊට අමතරව පරිහරණයට ලක්නොවූ විශාල ළඳුකැලෑ ඉඩම් ප්‍රමාණයක් රජයේ හා කතරගම දේවාල සන්තකව පවතී. මහකන්නයේදී මෙවැනි කැලෑබිම් ගිණිතබා ප්‍රදේශයේ ගොවීහු හේන්ගොවිතැන සඳහා යොදාගනිති.

2.7 සංඛ්‍යා සටහන.

විවිධ ප්‍රමාණයන් යටතේ ඉඩම් පරිහරණය කරනු ලබන පවුල් ඒකක ප්‍රමාණයන් හා ප්‍රතිශතයන් (නිකවැව වසම).

| ඉඩම් ප්‍රමාණයන් (අක්කර). | ගොඩ ඉඩම් | | මඩ ඉඩම් | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0<= 0.5 | 7 | 3.6 | 11 | 16.7 |
| 0.5<= 1.0 | 59 | 30.6 | 47 | 71.2 |
| 1.0<= 1.5 | 10 | 5.2 | 1 | 1.5 |
| 1.5<=2.0 | 63 | 32.6 | 6 | 9.1 |
| 2.0<=3.0 | 29 | 15.0 | 0 | 0.0 |
| 3.0<=5.0 | 15 | 7.8 | 1 | 1.5 |
| 5.0< | 10 | 5.2 | 0 | 0.0 |
| එකතුව | 193 | 100.0 | 66 | 100.0 |

*මූලය : පාදක සමීක්ෂණය - 2003*

සටහන: ප්‍රතිචාරීන් හතරදෙනෙකු ඉඩම් නොමැති අය සේ වාර්තාවිය.

2.7 සංඛ්‍යා සටහන මගින් විවිධ ප්‍රමාණයන් යටතේ ඉඩම් පරිහරණය කරනු ලබන පවුල් ඒකක සංඛ්‍යාවන් හා ප්‍රතිශතයන් පෙන්නුම් කෙරේ. මේ අනුව වැඩිම පවුල් ඒකක සංඛ්‍යාවක් අක්කර 1.5 ත් 2 ත් අතර ගොඩ ඉඩම් ප්‍රමාණයක් භුක්ති විඳී. එය ප්‍රතිශතයක් ලෙස ගතහොත් සමස්ත ගොඩ ඉඩම් හිමි පවුල් සංඛ්‍යාවෙන් 32.6% කි. සමස්තයක් ලෙස අක්කරයකට වැඩි ගොඩ ඉඩම් හිමි පිරිස වශයෙන් සැළකුවහොත් 65.8% ක පවුල් ප්‍රමාණයක් ඒ තුළට වැටේ. මේ අනුව ප්‍රදේශයේ ජනතාව පෞද්ගලික පරිහරණය කරන ඉඩම් ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා බව පෙනේ. මේ සඳහා හේතුවී ඇත්තේ තවමත් මෙම ප්‍රදේශය ජනාකීර්ණ වූ ප්‍රදේශයක් නොවීමත් රජයේ හා දේවාල සන්තකව විශාල ඉඩම් ප්‍රමාණයක් කැලෑබිම් වශයෙන් දැනටමත් පැවතීමත්ය. මෙවැනි ඉඩම්වල බලහත්කාරයෙන් හෝ අනවසරයෙන් ජනතාව පදිංචි වන අතර ඒ තුළින් විශාල බිම් ප්‍රමාණයක් පරිහරණයට නතුකර ගනී. විශේෂයෙන්ම හේන් ගොවිතැන සඳහා මෙසේ ඉඩම් අත්පත් කරගැනීමක් දක්නට ලැබේ. කල්යත්ම එවැනි ඉඩම් දිගුකාලයක් තිස්සේ පුද්ගල පරිහරණයට ලක්වූ ඒවා බවට පත්වේ. අක්කර 1/2 ට අඩු ගොඩ ඉඩම් හිමිකාරත්වය ඇති පවුල් ලෙස වාර්තා වී ඇත්තේ 3.6% පමණි. පාදක සමීක්ෂණය තුළින් පවුල් 04 ක් ඉඩම් අහිමි ලෙසට වාර්තාවී ඇත. එයට හේතුව ඔවුන් පියා යටතේ පවතින ඉඩම්වල වෙනම නිවාස තනා ජීවත් වීමයි. මේ හේතුවෙන් ඔවුන්ට පෞද්ගලික හිමිකාරිත්වයක් නොමැත.

ගම්මානයේ ඉඩම් හිමි සමස්ත පවුල් ප්‍රමාණයෙන් 32.2% කට මඩ ඉඩම් හිමිකාරත්වයද ඇත. නිකවැව, ගල්වලේ වැව, ගල්අමුණ ආදී කුඩා වැව් යටතේ මෙකී කුඹුරු ඉඩම් ව්‍යාප්තව පවතී. කෙසේ නමුත් මඩ ඉඩම් හිමි පවුල් වලින් 88%කට අක්කර එකක් හෝ ඊට අඩු බිම් ප්‍රමාණයක් හිමිව පවතී. විශේෂයෙන්ම සුළු පරිමාණ ජල යෝජනා ක්‍රම යටතේ පවුලකට කුඹුරු ඉඩම් අක්කර එක බැගින් රජය මගින් ලබාදීම මෙයට හේතුවී ඇත.

2.8 සංඛ්‍යා සටහන.

ඉඩම් ආශ්‍රිත ගැටළු (නිකවැව ග්‍රා.නි. වසම)

| ගැටළුවේ ස්වභාවය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| තාවකාලික බලපත්‍ර සහිත වීම | 5 | 14.3 |
| ඔප්පුවේ සඳහන් ප්‍රමාණය නොමැතිවීම | 1 | 2.9 |
| රජයෙන් බලපත්‍ර නොලැබීම | 14 | 40.0 |
| නිශ්චිත සීමා නොමැතිවීම | 2 | 5.7 |
| ඔප්පු නොමැතිවීම | 13 | 37.1 |
| එකතුව | 35 | 100.0 |

*මූලය : පාදක සමීක්ෂණය 2003*

නිකවැව ග්‍රාමනිලධාරී වසමෙහි ඉඩම් ආශ්‍රයෙන් කැපීපෙනෙන ගැටළු කිහිපයක්ද අධ්‍යයනය මගින් මතුවී පෙනුණි. ඒ අතරින් ඉතා ප්‍රබලතම ගැටළුව වූයේ ගල්වලේ වැව යටතේ ගොවීන් අතර බෙදාදී ඇති අක්කර 58ක කුඹුරු ඉඩම් සඳහා නිශ්චිත සීමා නොමැතිවීම හා අයිතිය තහවුරු කරගැනීම සඳහා ඔප්පු ලබා නොදීමයි. ඊට අමතරව රජය විසින් දැනට පුද්ගලයින් පරිහරණය කරනු ලබන වෙනත් ඉඩම් සඳහා බලපත්‍ර හෝ ඔප්පු ලබා නොදීම කැපීපෙනෙන ගැටළුවක් විය. වාර්තා වූ ගැටළුවලින් 77% ක් මෙසේ ඔප්පු හෝ බලපත්‍ර නොමැතිවීම මත පදනම් විය. විශේෂයෙන්ම ජනගහන ප්‍රසාරණයත් සමග රජයේ කැලෑ ඉඩම් හෙළිකර මිනිසුන් පදිංචිවීම තුළ මෙවැනි ගැටළුකාරී තත්ත්වයක් මතුවී ඇත. වාර්තාවූ ගැටළුවලින් 14.3% තාවකාලික බලපත්‍ර මත පදනම් විය. මෙහිදී ගම්වාසීන්ගේ ඉල්ලීම බවට පත්වූයේ මෙවැනි ඉඩම් ස්ථිර ඔප්පු සහිත ඒවා බවට පත්කරදෙන ලෙසයි. කෙසේ නමුත් අනවසර රජයේ ඉඩම්වල මෙසේ පදිංචි වී සිටින පිරිස් වෙත ස්ථිර හිමිකාරීත්වය ලබාදීම විවිධාකාර ගැටළු මතුකරන්නක් බව අදාළ නිලධාරීන් සමග සාකච්ඡා කිරීම්වලදී හෙළිවිය.

2.4.4. කෘෂිකර්මය :-

නිකවැව ග්‍රාමනිලධාරී වසම ශ්‍රී ලංකාවේ වියළි දේශගුණික කලාපයට අයත්වූවකි. මෙහි වියළි කලාපයට ආවේණිකවූ තුන්පත් භෝග රටාව දක්නට ලැබේ. එනම් හේන් වගාව, කුඹුරු

ගොවිතැන හා ස්ථාපිත ගෙවතු වගාවයි. වසරේ ඔක්තෝම්බර්- නොවැම්බර් කාල වකවානුවේදී ප්‍රදේශයට ලැබෙන අන්තර්මෝසම් වැසි සමග මහකන්නයේ හේන් වගාව ආරම්භ වෙයි. ජූලි අගෝස්තු මාසවලදී කළෑ ඉඩම් හෙළිකර පුළුස්සා හේන් වගාව සඳහා බිම් සකසනු ලබයි. මහවැසි ආරම්භයත් සමග බීජ සිටුවීම ආරම්භ කරයි. මෙවැනි හේන්වල කුරක්කන්, තල, බඩඉරිඟු, මෙනේරි, මුං, කව්පි, රටකජු හා එළවළු වර්ග වගාකරනු ලබයි. වර්තමානයේ ගොවීන් අතර රටකජු වගාව සඳහා ප්‍රමුඛත්වයක් ලැබී ඇතිබව ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් හෙළිවිය. විශේෂයෙන්ම තල, කුරක්කන් ආදී වූ බෝග සඳහා ගොවීන් බලාපොරොත්තු වන මිල නොලැබීම හේතුවෙන් ඔවුන් අධෛර්යමත් වී ඇතිබව පෙනේ. මහකන්නයේ අස්වනු නෙලනු ලබන කාල වකවානු වන වසරේ පෙබරවාරි- මාර්තු මාසවලදී ඉහත සඳහන්කළ බෝගයන්හි මිල ගණන් ප්‍රදේශයතුළ පහළයාමක් සිදුවේ. මේ සඳහා ඉහළ සැපයුමෙහි බලපෑම හේතුවේ. හේන් වගාව යනු එක් අතකින් අවදානම ඉහළ වගාවකි. අපේක්ෂිත පරිදි වැසි නොලැබුණහොත් වගා පාළු වීමට ලක්වේ. මේ හේතුවෙන් ගොවීන් වැඩි බිම් ප්‍රමාණයක් වගාවට යොදාගන්නා අතර ඒකක ඵලදායිතාවය පිළිබඳ එතරම් සැළකිල්ලක් නොදක්වයි. අනෙක් අතින් වසරේ ඉතිරි කාල පරිච්ඡේදය සඳහා අවශ්‍ය වන ආහාර හා අනෙකුත් වියදම් මෙම හේන්වගාව තුළින් උපයා ගැනීමක් දක්නට ලැබේ.

හේන්වගාව සඳහා විශේෂිතවූ කෘෂි උපදෙස් ලබාගැනීමක් දක්නට නොමැත. වගා ක්‍රමවේදයන් ගොවීන්ගේ පාරම්පරික දැනුම මත පදනම් වී ඇත. බීජ සකසා ගන්නේද තමන්ගේම හේන තුළින් හෝ වෙනත් ගොවියෙකු සමග හුවමාරුව තුළිණි. වර්තමානය වනවිට සමහර ගොවීන් යම්තාක් දුරට වැඩිදියුණු කළ බීජ වෙතද යොමුවීමක් දක්නට ලැබේ. වල්නාශක හා කෘමිනාශකද භාවිතා කරනු ලබයි. සම්ප්‍රදායික හේන් වගාවට අනුව ගොවිබිම් මාරුකිරීම කැලෑ ඉඩම් සීමා වීමත් සමග යම්තාක් දුරකට සීමාවීමක් දක්නට ඇත. කෙසේ නමුත් ගොවීන් දිගින් දිගටම එකම බිම් කොටසක් තුළ වගා කිරීමට කැමැත්තක් නොදක්වයි. පොහොර හා කෘමිනාශක වැඩිපුර යෙදීමට සිදුවීම මේ සඳහා හේතු වී ඇත. ලඳුකැලෑ විනාශය හේන්වගාව සමග බැඳී ඇති ප්‍රබල ගැටළුවකි.

හේන් ගොවිතැනට අමතරව ප්‍රධාන ලෙසම කැපීපෙනෙන වගා ක්‍රමය ගෙවතු වගාවයි. විශේෂයෙන්ම මහකන්නයේ සම්පූර්ණ ගෙවත්තම වාගේ විවිධ වගාවන් සඳහා වෙන්වේ. මෙහිදී රටකජු, බඩඉරිඟු, මුං, කව්පි හා එළවළු, පළතුරු වැනි ගොඩබෝග බහුලව වගාකෙරේ. යලකන්නයේදී කෘෂිළිං ආශ්‍රිතව ගෙවතු වගාවල නිරතවේ. එහෙත් වගාවට ප්‍රමාණවත් තරම් ජලය ඇති එවැනි කෘෂි ලිං ඇත්තේ පවුල් 12ක් පමණ වූ සුළු ප්‍රමාණයකට පමණි.

තෙවනුව වී ගොවිතැන කැපීපෙනේ. ගම පුරා විසිරී ඇති කුඩා වැව් කිහිපයක් යටතේ කුඹුරුබිම් ව්‍යාප්තව පවතී. නිකවැව, ගල්වලේ වැව, ගල්කොටුව වැව් මේ අතරින් ප්‍රමුඛස්ථානයක් ගනී. මේවායෙහි මහකන්නයේ වී වගාව සිදුකරන අතර ජල ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් යල කන්නයේ වී වගාව හෝ අතිරේක භෝග වගාකරනු ලබයි. බොහෝවිට සිදුවන්නේ යල කන්නයේදී කුඹුරු ඉඩම්වල අතිරේක භෝග වගාවන් සිදුකිරීමයි. වී ගොවිතැන සඳහා සුළු වශයෙන් කෘෂිඋපදෙස් ලබාගැනීමක් දක්නට ලැබෙන අතර යම්කිසි ප්‍රමාණයකට කෘමිනාශක, වල්නාශක හා

රසායනික පොහොර යෙදීමෙන් පමණක් ලැබේ. ඒ අනුව අක්කරයකට බුසල් 60 ක් පමණ [illegible] අස්වැන්නක් ලබා ගන්නා බව දක්නට ලැබෙන අතර මෙය නවීන තාක්ෂණික භාවිතයෙන් තවත් වැඩිකල හැකිබව පෙනී යයි. අදාල යෙදවුම් නගරයේ වෙළඳ සැල්වලින් හා ගොවිජනසේවා මධ්‍යස්ථානයෙන් ලබාගැනීමේ හැකියාව ගොවීන්ට ඇත. වී වගාවේදී වැඩිදියුණු කළ නවබීජ වර්ග ලබාගැනීමේදී ගොවීන්ට ගැටළු සහගත තත්ත්වයන්ට මුහුණදීමට සිදුවේ. විශේෂයෙන්ම ඒ සඳහා අවශ්‍යතාව තිබුනද බීජ ලබාගැනීමට ස්ථානයක් හෝ ක්‍රමයක් බොහෝ ගොවීන් නොදනී. ඒ සමගම නව බීජවල ඵලදායීතාවය පිළිබඳ අවබෝධයක්ද නොමැත. විශේෂයෙන්ම ප්‍රදේශයේ ඉතා බහුල සම්පතක් වන ගොම පොහොර කුඹුරුවලට යෙදීමට ගොවීන් මැලිකමක් දක්වයි. කෙසේ නමුත් අස්වැන්න නෙලාගැනීමෙන් පසු ඉතිරිවන පිදුරු කුඹුරට නැවත වරක් යෙදීමට ගොවීහු හුරුපුරුදු වී සිටිති. නිකවැව ගම්මානයේ වී ගොවිතැන මහා පරිමාණයෙන් සිදුනොවන අතර එහිදී අලෙවිය පිළිබඳ ගැටළු පැනනොනගී. බොහෝවිට තම පරිභෝජන අවශ්‍යතා සපුරාගැනීම වෙනුවෙන් වී වගාව සිදුවේ. ඒ බව අපගේ පාදක සමීක්ෂණයෙන්ද හෙළිවූ පරිදි අක්කර එක හෝ ඊට අඩු කුඹුරු ඉඩම් හිමි පිරිස අති බහුතරය වීම තුළින් සනාථවෙයි.

### 2.4.5. සත්ත්ව පාලනය.

2002 කෘෂි සංගණන වාර්තාවට අනුව නිකවැව ගම්මානයේ එළහරක් 206 ක් ඇත. ඉන් 32 ක් කිරි සඳහා ඇතිකරනු ලබන කිරිදෙනුන්ය. සමස්ථ මී හරක් සංඛ්‍යාව 165 ක් වන අතර ඉන් 93 ක් කිරි සඳහා ඇතිකරන මී දෙනුන්ය. ගම්මානය තුළ ඇතිකරනු ලබන එළුවන් සංඛ්‍යාව 28 කි. බිත්තර සඳහා ඇතිකරනු ලබන කුකුළන් සංඛ්‍යාව 19 කි. නිකවැව වසමෙහි සත්ත්ව පාලනය වෙත යොමුවී ඇති බවට වාර්තාවූ පවුල් සංඛ්‍යාව 31 කි. ඉන් 71% ක් කිරි ලබාගැනීමේ පරමාර්ථ මත සතුන් ඇතිකිරීමෙහි යෙදෙයි. කෙසේ නමුත් මෙකී එළ ගවයින්ගෙන් බහුතරය හොඳ වර්ගයේ වැඩි කිරි ප්‍රමාණයක් ලබාගත හැකි වර්ග නොවේ. මේ හේතුවෙන් මස් සඳහා අවට ප්‍රදේශවලින් පැමිණෙන වෙළෙඳුන්ට විකිණීමක්ද දක්නට ලැබේ. එළගවයින් වැඩ සඳහා යොදාගැනීම යන ශීර්ෂය යටතේ කරත්ත වලින් බඩු ඇදීමට සතුන් යොදාගැනීම පෙන්නුම් කෙරේ. කෙසේ නමුත් ප්‍රදේශයේ කරත්ත මේ වනවිට එතරම් ප්‍රචලිත ප්‍රවාහන මාධ්‍යයක් බවට පත්ව නැත. අත්ට්‍රැක්ටර් හා වෙනත් මාර්ග මේ වෙනුවට ආදේශවී ඇත. මේ හේතුවෙන් එක් ගොවියෙකු පමණක් වැඩ සඳහා මී ගවයින් යොදාගැනීමක් දක්නට ලැබුණි.



පුස්තකාලය
LIBR
HAKH

2.9 සංඛ්‍යා සටහන.

සත්ත්ව පාලනයේ නිරත පවුල් ප්‍රමාණය හා ප්‍රතිශතය (නිකවැව වසම)

| සත්ත්ව වර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| මී ගවයින් (කිරි සඳහා) | 22 | 71.0 |
| මී ගවයින් (වැඩ සඳහා) | 1 | 3.2 |
| එළ ගවයින් (කිරි සඳහා) | 6 | 19.4 |
| එළ ගවයින් (වැඩ සඳහා) | 0 | 0.0 |
| එළුවන් | 1 | 3.2 |
| කුකුළන් (බිත්තර සඳහා) | 1 | 3.2 |
| කුකුළන්(මස් සඳහා) | 0 | 0.0 |
| එකතුව | 31 | 100.0 |

*මූලය - පාදක සමීක්ෂණය - 2003*

සත්ත්ව පාලනය යටතේ මීහරක් ඇතිකරනු ලබන පවුල් ප්‍රතිශතය එහි නිරතවන පවුල් අතරින් 19.4% කි. රුහුණේ මී කිරි සඳහා ඉහළ ඉල්ලුමක් ලංකාව පුරාම පැවතීම නිසා මෙම ප්‍රදේශයන්හි කිරි සඳහා ද හොඳ වෙළඳපොළක් නිර්මාණය කර ඇත. මේ හේතුවෙන් මී හරක් ඇතිකිරීමේ එකම පරමාර්ථය කිරි ලබාගැනීම බවට පත්වී ඇත. මුල්කාල වකවානුවල මී ගවයින් කුඹුරු වැඩ සඳහා බහුලව යොදාගත්තද අද වනවිට තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස්වී ඇත. ඒ සඳහා ට්‍රැක්ටර්, කොළමඩින යන්ත්‍ර වැනි නූතන තාක්ෂණය ගමට පැමිණ ඇත. නිකවැව වසමෙහි ජනතාව සත්ත්ව පාලනය ලෙස ගවයින් ඇති කිරීමට අමතරව අනෙකුත් සතුන් ඇතිකිරීමට දක්වන්නේ ඉතා පහළ රුචිකත්වයකි. මේ හේතුවෙන් එළුවන් ඇතිකරන පවුල් ලෙස හඳුනාගත හැකිවුයේ එක් පවුලකි. විශේෂයෙන්ම එළුවන්ට අවශ්‍ය ආහාර වියළි කාල වකවානුවලදී ලබාදීම ගැටළු සහගත වීමත් ගවයින් මෙන් නිදැල්ලේ ඇතිකිරීමට නොහැකිවීමත් මේ සඳහා හේතුසාධක ලෙස දක්වයි. කුකුළු පාලනයද මූලික ලෙසම බිත්තර ලබාගැනීම මත පදනම් වූ අතර එක් පවුලක් පමණක් ගම්මානයෙන් වාර්තාවිය.

සතුන්ව පාලනය සම්බන්ධයෙන් මතුවී ඇති ගැටළු කිහිපයක්ද ප්‍රදේශයෙන් හඳුනාගත හැකිවිය. ඒ අතරින් උසස් වර්ගයේ සතුන් ලබාගත නොහැකිවීම ප්‍රධාන ගැටළුවකි. වැඩිදියුණුකළ දෙමුහුන් සතුන් ලබාගැනීමට වැඩි රුචිකත්වයක් ගොවීන් දක්වයි. ඒ සඳහා විධිමත් වැඩ සටහනක් ක්‍රියාත්මක වන බවක් නොපෙනේ. කෘතිම සිංචනය පිළිබඳව ගොවීන් තුළ එතරම් රුචිකත්වයක් නොමැත. ඒතුළින් පිරිමි සතුන් ඇතිවන බවත් බොහෝවිට අසාර්ථක වියහැකි බවත් ඊට හේතු වශයෙන් දක්වයි. මේ හේතුවෙන් ගොවීන්ගේ ඉල්ලීම් වුයේ හොඳ වර්ගයේ පිරිමි සතුන් ලබාදෙන ලෙසයි.

සත්ත්ව පාලනය හා බැඳී පවතින තවත් ගැටළුවකි සතුන් වෙනුවෙන් තණබිම් නොමැතිවීම. මේ හේතුවෙන් ගවයින්ට අවශ්‍ය ආහාර සපයාගැනීම ගැටළුවක්ව පවතී. එය අනෙකුත් ගොවීන්ටද බලපෑමක් ඇති කරන්නක් බවට පත්ව ඇත. එනම් නිදැල්ලේ යන ගවයින්ගෙන් තම වගා පාළු වීම සිදු වීමයි. මේ හේතුවෙන් ගම තුළ ගව පාලනයට විරුද්ධ වන පිරිසද ඉහළ මට්ටමක පවතී. කෙසේ නමුත් සත්ත්ව පාලනය සම්බන්ධ ව්‍යාප්ති සේවාවන් පහළ මට්ටමක පවතින බව සමීක්ෂණය තුළින් හෙළිවිය. වර්තමානය වනවිට සත්ත්ව පාලනය සම්බන්ධව මතුවී ඇති තවත් ගැටළුවකි සොරසතුරු උවදුර. එනම් අවට ප්‍රදේශවලින් පැමිණ මස් සඳහා ගවයින් සොරකම් කරගෙන යාමයි. ඊට අමතරව කිරිලබාගැනීම සම්බන්ධ පුහුණු ශ්‍රමික හිඟයක්ද පවතින බව ගොවීන්ගෙන් හෙළිවිය.

ගවයින්ගෙන් ලබාගන්නා කිරි අලෙවිකිරීම පිළිබඳ ගැටළුවක් ප්‍රදේශය තුළින් හඳුනාගත නොහැක. බාහිර ප්‍රදේශවල සිට කිරි එකතු කරන්නන් ගොවිපළ වෙතම පැමිණ කිරි මිලදී ගනී. ඊට අමතරව ගොවීන්ම කිරි මුදවා අලෙවි කිරීමක්ද සිදුකරයි.

### 2.4.6. ස්වයං රැකියා (ගොවිපල නොවන කාර්යන්)

කෘෂිකාර්මික කටයුතුවලට අමතරව කැපීපෙනෙන ස්වයංරැකියා ව්‍යාප්තියක් ගම තුළින් හඳුනාගත නොහැක. සමස්ථ ගම්මානයෙන්ම ස්වයං රැකියාවල නියුතු පුද්ගලයන් ලෙස හඳුනාගත හැකිවූයේ 23 දෙනෙකු පමණි. ඉන් 74% ක් සුළු ව්‍යාපාර අවස්ථාවන් වශයෙන් වෙළඳසැල් පවත්වාගෙන යන්නන්ය. මෙම වෙළඳසැල් උඩවලව- කොළඹ මාර්ගය දෙපස පිහිටා ඇති අතර ප්‍රදේශයේ නිෂ්පාදිත එළවළු හා පළතුරු වර්ග විකිණීම මේවායෙහි සිදුකෙරේ. ප්‍රදේශයේ නිෂ්පාදිත කෘෂිද්‍රව්‍ය සඳහා ඉහළ මිලක් ලබාගැනීම සඳහා මෙය උචිත මාර්ගයකි.

### 2.10 සංඛ්‍යා සටහන.

ස්වයං රැකියා ක්‍රියාකාරකම් (නිකවැව වසම).

| ස්වයං රැකියාවේ ස්වභාවය | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| සුළු ව්‍යාපාර (වෙළඳ සැල්) | 17 | 74 |
| පෙර පාසල් | 1 | 4.34 |
| ඇඳුම් මැසීම | 3 | 13.04 |
| මනාලියන් හැඩගැන්වීම | 1 | 4.34 |
| මෝටර් කාර්මික | 1 | 4.34 |
| එකතුව | 23 | 100.0 |

*මූලය : පාදක සමීක්ෂණය 2003*

ඊට අමතරව ස්වයං රැකියාවල නිරතවූවන්ගෙන් 13% ක් ඇඳුම් මැසීමෙහි කටයුතුවල නිරතවූවන්ය. මනාලියන් හැඩගැන්වීම, පෙරපාසල් පවත්වාගෙන යාම හා මෝටර් කාර්මිකයන් වශයෙන් ස්වයංරැකියාවල නිරතවන්නන් ඉතා සුළු අනුපාතවලින් යුක්තවිය. නිකවැව වසම තුළ ස්වයං රැකියා අවස්ථාවන් වශයෙන් දියුණුකළ හැකි අංශ කිහිපයක්ද අඳුනාගත හැකිය. ප්‍රදේශයතුළ බහුල කෘෂි නිෂ්පාදන ආශ්‍රයෙන් රසකැවිලි නිෂ්පාදන කර්මාන්තයත් දියුණුකරන්නේ නම් ඒතුළින් අඩු පිරිවැයකින් වැඩි ප්‍රතිලාභයක් ලැබිය හැකිය. එහිදී තල කැරලි නිෂ්පාදනය වැන්නක් කැපීපෙනෙන්නකි. ප්‍රදේශය තුළින් අඩු පිරිවැයකින් මෙවැනි ද්‍රව්‍ය ලබාගතහැකි වුවද ඒ සම්බන්ධිත නියම තාක්ෂණය ප්‍රදේශවාසීන් සතුව නොපවතී. එය කර්මාන්තයක් ලෙස දියුණු කිරීමේදී ප්‍රබල ගැටළුවකි. සමහර පුද්ගලයින් මෙවැනි නිෂ්පාදන අත්හදාබැලීම් ලෙස සිදුකළද එයින් සාර්ථක ප්‍රතිඵල ලබාගත නොහැකිවී ඇත. නිවැරදි තාක්ෂණික ක්‍රම හා උපදෙස් ඒ පිළිබඳ කැමැත්තක් ඇති අයහට ලබාදෙන්නේනම් එය දියුණුකරගත හැකිවනු ඇත.

අනෙක් අතින් ස්වයං රැකියා මුහුණපාන ප්‍රබල ගැටළුවකි අලෙවිය. ප්‍රදේශයේ පවතින වෙළඳපොළ ඉතා පටු බැවින් බාහිර වෙළඳපොළ කෙරෙහි අවධානය යොමුකළ යුතුය. එවැනි හැකියාවක් ප්‍රදේශවාසීන් සතුව නොපවතී. යම් බාහිර ආයතනයක් මැදිහත්ව නිෂ්පාදන දිරිගන්වා අලෙවි කිරීමේ මාර්ග සකස් කරන්නේනම් ප්‍රදේශවාසීන්ට ඒ තුළින් තම ස්වයං රැකියා දියුණු කරගත හැකිවනු ඇත.

## 2.5 අධ්‍යාපන තත්ත්වය.

ගමෙහි පදිංචිකරුවන්ගේ සාක්ෂරතාව පිළිබඳ විශේෂ ලක්ෂණයක් වන්නේ එය ශ්‍රී ලංකාවේ සාක්ෂරතා මට්ටම ඉක්මවා තිබීමයි. 2000 වසරේදී ශ්‍රී ලංකාවේ වැඩිහිටි සාක්ෂරතා මට්ටම පුරුෂයින්ගේ 94.4% ද කාන්තාවන්ගේ 89.0% ද වූ අතර දෙපාර්ශවයේම සාක්ෂරතා මට්ටම 91.7% විය (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2001). නිකවැව ගම්මානයේ වැඩිහිටි පුරුෂ සාක්ෂරතාව 98%, ද කාන්තා සාක්ෂරතාව 95% ද විය (වගු අංක 2.11.). දෙපාර්ශවයේම සාක්ෂරතා මට්ටම 96.% වීමෙන් සාක්ෂරතාව අතින් නිකවැව වසමෙහි වැසියන් සැළකිය යුතු ආකාරයේ ඉහළ මට්ටමක සිටින බව පෙන්නුම් කරනු ලබයි. මෙම ප්‍රගතියට හේතු වී ඇත්තේ සංක්‍රමණය වී පදිංචි වී ඇති බොහොමයක් දෙනා අධ්‍යාපනික වශයෙන් සාපේක්ෂව දියුණු තත්ත්වයක පවත්නා මාතර වැනි ප්‍රදේශ වලින් පැමිණීමත් එවැන්නන් තමන්ගෙන් පැවත එන්නන්ට ද යම්කිසි අධ්‍යාපනයක් ලබා දීමට උත්සාහ දැරීමත්ය.


2.11 සංඛ්‍යා සටහන :

වැඩිහිටි සාක්ෂරතා මට්ටම.(නිකවැව ග්‍රා.නි.වසම)

| කාණ්ඩය | ප්‍රතිශතය. |
|---|---|
| ස්ත්‍රී | 95 |
| පුරුෂ | 98 |
| මුළු | 96 |

*මූලාශ්‍රය - පාදක සමීක්ෂණය 2003*

එසේ වුවද ඔවුන් ලබා ඇති අධ්‍යාපනයේ ස්වභාවය විමසා බැලීමේදී පිළිබිඹු කරනුයේ යහපත් චිත්‍රයක් නොවේ. ගමෙහි පදිංචි අවු. 15 හා ඊට වැඩි ජනගහනයෙන් 7.4% ක් පාසල් අධ්‍යාපනය නොලැබුවන් වන අතර 72% ක් අ.පො.ස.(සා.පෙළ) දක්වා පමණක් අධ්‍යාපනය ලද හෝ ඊට අඩු මට්ටමකදී අධ්‍යාපනය හැර ගිය අය වෙති. මේ අනුව අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාව සතුටුදායක මට්ටමක පැවතියත් ලැබූ අධ්‍යාපන මට්ටම පිළිබඳ සළකා බැලීමේදී අවු 15 හා එයට වැඩි වයස් කාණ්ඩවල ජනගහනයෙන් 3/4 ආසන්න ප්‍රමාණයක් ප්‍රාථමික හා ද්විතියික මට්ටම්වලදී පාසල් හැරයාම තුළ ප්‍රදේශයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගැටළු මතු කරනු ලබන බව පෙනේ. මෙයට සාපේක්ෂව සා.පෙළ සහ උසස් පෙළ සමත් වන ප්‍රමාණය මෙන්ම උපාධිධාරීන් ප්‍රමාණයද ජාතික මට්ටමේ ප්‍රතිශතයන්ට වඩා බෙහෙවින් පහළ මට්ටමක සිටින බව පෙන්නුම් කරයි (2.12 සංඛ්‍යා සටහන).




අධ්‍යාපනය පිළිබඳ තත්ත්වය ස්ත්‍රී/පුරුෂ භාවය අනුව විමසන විට පළමු ශ්‍රේණියේ සිට අ.පො.ස. සා.පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ පිරිමි ප්‍රතිශතය 76.0% වන අතර කාන්තා ප්‍රතිශතය 67.9% කි. එමෙන්ම

සා.පෙළ සමත් වුවන් පිළිබද විමසීමේදී කාන්තා ප්‍රතිශතයට වඩා ආන්තිකව පිරිමි ප්‍රතිශතය වැඩි බවක් පෙන්නුම් කරනු ලබයි. අ:පො:ස: උසස් පෙළ සමත්, උපාධි අපේක්ෂක සහ උපාධිධාරී පිරිමි ප්‍රතිශතය 5.5% වන විට කාන්තා ප්‍රතිශතය 10.3% ක් වීමෙන් එම මට්ටමේදී පිරිමින් ප්‍රමාණය මෙන් දෙගුණයක් කාන්තාවන් විසින් නියෝජනය කරනු ලබන බව පෙනේ. ගමෙහි එක් උපාධිධාරිනියක් පමණක් සිටින අතර මේ තුළින් ද්විතීයික සහ තෘතියික අධ්‍යාපන මට්ටම්වලදී කාන්තාව පුරුෂ පක්ෂයට වඩා ඉදිරියෙන් සිටින බව පෙන්නුම් කරනු ලබයි.

2.12 සංඛ්‍යා සටහන

නිකවැව ග්‍රා.නි.වසමේ පවුල් සාමාජිකයන්ගේ අධ්‍යාපන මට්ටම (අවු.15 සහ එයට ඉහළ).

| අධ්‍යාපන මට්ටම | පුරුෂ | | ස්ත්‍රී | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය. | සංඛ්‍යාව | ප්‍රතිශතය. | සංඛ්‍යාව | ප්‍රතිශතය. |
| පාසල් නොගිය (සාක්ෂරතාව රහිත) | 12 | 3.9 | 22 | 7.7 | 34 | 5.7 |
| පාසල් නොගිය (සාක්ෂරතාව සහිත) | 05 | 1.6 | 05 | 1.8 | 10 | 1.7 |
| 1-5 ශ්‍රේණිය දක්වා පාසල් ගිය) | 90 | 29.1 | 64 | 22.5 | 154 | 26.0 |
| අ.පො.ස.සා.පෙළ දක්වා | 145 | 46.9 | 129 | 45.4 | 274 | 46.2 |
| අ.පො.ස.සා.පෙළ සමත් | 40 | 12.9 | 35 | 12.3 | 75 | 12.6 |
| අ.පො.ස. (උ.පෙළ) සමත් | 15 | 4.9 | 25 | 8.8 | 40 | 6.7 |
| උපාධිඅපේක්ෂක/උපාධිධාරී | 02 | 0.6 | 04 | 1.5 | 06 | 1.0 |
| එකතුව | 309 | 100 | 284 | 100.00 | 593 | 100.00 |

*මූලාශ්‍ර - පාදක සමීක්ෂණය -2003.*

සමීක්ෂණයට භාජනය වූ පවුල් 197 හි ගෘහමූලිකයන්ගෙන් 175 ක් පිරිමින් වූ අතර 22 ක් කාන්තාවන් විය. මෙම ගෘහමූලිකයන්ගෙන් 87.3% ක් අ.පො.ස.(සා.පෙළ) දක්වා හෝ එයට අඩු මට්ටමේ පාසල් අධ්‍යාපනයක් ලැබුවන් වන අතර ස්ත්‍රී පුරුෂ භාවය අනුව විමසුවහොත් පිරිමි ගෘහමූලිකයන්ගෙන් 89.2% ද, කාන්තා ගෘහමූලිකයන්ගෙන් 63.7% ක්ද එයට අයත් වේ. 9.6% ක් වූ පාසල් අධ්‍යාපනය නොලද ගෘහමූලිකයන් කාණ්ඩය තුළින් පෙන්නුම් කරන විශේෂ ලක්ෂණයක් වන්නේ,එකී කාණ්ඩයට අයත් පිරිමින්ගේ ප්‍රතිශතය මෙන් හයගුණයක පමණ ඉහළ අගයක් කාන්තාවන් වෙතින් පිලිබිඹු වීමයි (2.13 සංඛ්‍යා සටහන). ගෘහමූලිකයන් අතුරින් අ:පො:ස: (සා/පෙළ) සමත් ප්‍රතිශතය 4.1% තරම් ඉතාම පහළ මට්ටමක පවතී. ඉන් ඉහළ අධ්‍යාපනයක් ලැබූ ගෘහමූලිකයන් සමීක්ෂණයට භාජනය කළ පවුල්වල නොවීය.

2.13 සංඛ්‍යා සටහන

ගෘහ මූලිකයන්ගේ අධ්‍යාපන මට්ටම.(නිකවැව ග්‍රා.නි.වසම)

| අධ්‍යාපන මට්ටම | පුරුෂ | | ස්ත්‍රී | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය% | සංඛ්‍යාව | ප්‍රතිශතය% | සංඛ්‍යාව | ප්‍රතිශතය% |
| පාසල් නොගිය | 11 | 6.3 | 08 | 36.4 | 19 | 9.6 |
| 5 ශ්‍රේණිය දක්වා පාසල් ගිය | 78 | 44.6 | 08 | 36.4 | 86 | 43.7 |
| 6 ශ්‍රේණියේ සිට අ.පො.ස. සා.පෙළ දක්වා | 78 | 44.6 | 06 | 27.3 | 84 | 42.6 |
| අ.පො.ස.සා.පෙළ සමත් | 08 | 4.6 | 0 | 0.0 | 08 | 4.1 |
| එකතුව | 178 | 100.0 | 22 | 100.0 | 197 | 100.0 |

*මූලාශ්‍රය - පාදක සමීක්ෂණය - 2003*

වයස අවු. 5-14 අතර පාසල් නොයන ළමුන් සංඛ්‍යාව තිදෙනෙකි. පාසල් නොයාමට හේතුව ශාරීරික මානසික දුර්වලතාය. මෙම තිදෙනාම නිකවැව ග්‍රා.නි.වසමේ වීරපුර ගම්මානයේ පදිංචිකරුවන් වේ. අදාළ වයස් කාණ්ඩය තුළ සිටින බොහෝ දෙනකු පාසල් යන අය බවට සඳහන් වුවද ඉන් සෑහෙන පිරිසක් දිනපතා පාසලට යාමක් නොකරන බවත් විශේෂයෙන් හේන් ගොවිතැන් කෙරෙන කාලයට ඔවුන් තම පවුලේ ගොවිතැන් කටයුතුවලට සහාය වීම සඳහා වැඩි ප්‍රමුඛතාව ලබා දෙන බවත් ගම්වාසීන් සමග කළ සාකච්ඡාවන්හිදී අනාවරණය විය.

ගමෙහි පිහිටා තිබෙන නිකවැව කණිටු විද්‍යාලයේ ප්‍රාථමික ශ්‍රේණි (1-5 ශ්‍රේණී) දක්වා අධ්‍යාපන පහසුකම් සැපයෙන අතර ගමෙහි ළමුන් බහුතරය එහි අධ්‍යාපනය ලබයි. එක් ගොඩනැගිල්ලකින් සමන්විත වන පාසලේ ජල පහසුකම් නොමැති අතරම ඩෙස් පුටු ආදී පාසල් උපකරණ පහසුකම් ඉතාම අවම මට්ටමක පවතී. ගම්වැසියන් සමග සාකච්ඡා කිරීමේදී අනාවරණය වුයේ පාසලට පිට ප්‍රදේශවලින් පත්ව එන ගුරුවරුන් ඉතා කෙටි කාලයකින් ස්ථාන මාරුවීම් ලබාගෙන ආපසු යන බවත්, පවතින ප්‍රවාහන අපහසුතා නිසා ගුරුවරුන් නිරන්තරයෙන්ම ප්‍රමාද වී පාසලට පැමිණීම සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් අහිතකර අන්දමට බලපෑම් කරනු ලබන එක් සාධකයක් වන බවත්ය.

## 2.6 නිවාස වල තත්ත්වය හා අයිතිය.

ගමෙහි සමීක්ෂණයට භාජනය වු පවුල් 197න් 95.9% ක් තරම් ඉහළ ප්‍රතිශතයකට ස්ව හිමිකම සහිත නිවාස විය. තමන්ට අයත් නොවන නමුත් කුළී හෝ බදු නොගෙවා පදිංචි වී සිටින නිවාස 3.6% (2.14 සංඛ්‍යා සටහන)කි. එම නිවාස වලින් බහුතරය, එනම් නිවාස 05ක් නිකවැව

ගම්මානයට අයත් විය. තමන්ට අයිති නොවුවද මෙම නිවාස සියල්ලම පාහේ පදිංචිකරුවන්ගේ දෙමව්පියන්ට හෝ දූදරුවන්ට අයත් ඒවා විය.

2.14 සංඛ්‍යා සටහන

නිවාස අයිතියේ ස්වභාවය. (නිකවැව ග්‍රා.නි.වසම)

| අයිතියේ ස්වභාවය. | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| තමන්ගේ | 189 | 95.9 |
| කුළියට | 01 | 0.5 |
| බද්දට | 0 | 0.0 |
| වෙනත් අයෙකුට හිමි නමුත් කුළී නොගෙවන | 07 | 3.6 |
| වෙනත් | 0 | 0.0 |
| එකතුව | 197 | 100.0 |

*මූලාශ්‍රය - පාදක සමීක්ෂණය - 2003*

නිවාස වලට ප්‍රවේශවීමේ හැකියාව පිළිබඳව විමසීමේදී ගමෙහි නිවාසවලින් 90.4% කට වාහනයකින් ප්‍රවේශවීමේ හැකියාව පවතී (2.15 සංඛ්‍යා සටහන). ගමෙහි නිවාස ව්‍යාප්තිය අනුව නිවාසවලින් අතිබහුතරය මාර්ග දෙපස පිහිටා ඇති අතර අතුරු මාර්ග සහ අඩිපාරවල් ඔස්සේ ප්‍රවේශවීමට ඇති නිවාස ප්‍රමාණය ඉතාම සීමිතය.

2.15 සංඛ්‍යා සටහන

වාහනයකින් ප්‍රවේශවීමේ හැකියාව අනුව නිවාස (නිකවැව ග්‍රා.නි.වසම).

| කාණ්ඩය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ප්‍රවේශවීමේ හැකියාව සහිත | 178 | 90.4 |
| ප්‍රවේශවීමේ හැකියාව රහිත | 19 | 9.6 |
| එකතුව | 197 | 100.0 |

*මූලාශ්‍ර - පාදක සමීක්ෂණය 2003*

හේන් ගොවිතැනට ප්‍රමුඛත්වයක් ලබා දී ඇති ගම්මානයක් වන මෙහි මාර්ග දෙපස නිවාස ස්ථාපිත කර ඉන් ඔබ්බට හේන් වගාව සඳහා යොදවා ගෙන තිබීම නිසා නිවාසවලින් අතිබහුතරයකට වාහනයකින් ප්‍රවේශවීමේ හැකියාව ලැබී ඇත.

මෙම නිවාසවලින් අඩකට ආසන්න ප්‍රමාණයක් (49.2%) බිත්ති ගඩොලින් බැද උළු හෝ ඇස්බැස්ටස් සෙවිලිකර, පොළව සිමෙන්ති දමා තැනූ ගොඩනැගිලි වේ. මෙයට අමතරව නිවාස 18.3% ක ප්‍රමාණයක් ගඩොලින් බිත්ති බැද වහලෙහි උළු හෝ ඇස්බැස්ටස් සෙවිලිකර බිම මැටි දැමූ නිවාස වේ. නිවාසවලින් 8.6%ක ප්‍රමාණයක් පමණක් මැටි බිත්ති සහ පොළව සහිතව වහලට පොල්

අතු සෙවිලිකරන ලද ඒවා වේ. මේ අනුව ගමේ නිවාසවලින් බහුතරයක් බිත්ති ගඩොලින් නිම කර වහලට උළු හෝ ඇස්බැස්ටස් සෙවිලිකරන ලද ස්ථිර මට්ටමට ගොඩනගන ලද ඒවා වේ.

2.16 සංඛ්‍යා සටහන


ගොඩනැගිලි තැනීමට භාවිතා කරන ද්‍රව්‍ය අනුව නිවාස (තිකවැව ග්‍රා.නි.වසම).

| භාවිත ද්‍රව්‍ය | වහල | බිම | බිත්ති | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 1 | උළු | සිමෙන්ති | ගඩොල් | 94 | 47.7 |
| 2 | උළු | සිමෙන්ති | මැටි | 03 | 1.5 |
| 3 | උළු | මැටි | මැටි | 31 | 15.7 |
| 4 | උළු | මැටි | ගඩොල් | 35 | 17.8 |
| 5 | උළු | මැටි | වෙනත් | 0 | 0.0 |
| 1 | යකඩ තහඩු/ඇස්බැස්ටස්. | සිමෙන්ති | ගඩොල් | 03 | 1.5 |
| 2 | යකඩ තහඩු/ඇස්බැස්ටස්. | සිමෙන්ති | මැටි | 03 | 1.5 |
| 3 | යකඩ තහඩු/ඇස්බැස්ටස්. | මැටි | ගඩොල් | 01 | 0.5 |
| 4 | යකඩ තහඩු/ඇස්බැස්ටස්. | මැටි | මැටි | 04 | 2.0 |
| 5 | යකඩ තහඩු/ඇස්බැස්ටස්. | මැටි | වෙනත් | 0 | 0.0 |
| 1 | පොල්අතු | සිමෙන්ති | ගඩොල් | 0 | 0.0 |
| 2 | පොල්අතු | සිමෙන්ති | මැටි | 0 | 0.0 |
| 3 | පොල්අතු | මැටි | ගඩොල් | 06 | 3.0 |
| 4 | පොල්අතු | මැටි | මැටි | 17 | 8.6 |
| 5 | පොල්අතු | මැටි | වෙනත් | 0 | 0.0 |
| මුළු ගණන | | | | 197 | 100.0 |

*මූලාශ්‍රය - පාදක සමීක්ෂණය -2003*

තිකවැව ග්‍රා.නි.වසමෙහි නිවාසවලට රාත්‍රීකාලයේ ආලෝකය ලබා ගන්නා ප්‍රධාන ප්‍රභවය වන්නේ භූමිතෙල්ය. එය 85.3% තරම් ඉහළ මට්ටමක පවතී. සූර්යකෝෂ භාවිතය 6.6% වන අතර පහසු ගෙවීමේ ක්‍රමයට ගම්වාසීන් සූර්යකෝෂ සපයාගෙන ඇත. ප්‍රධාන විදුලි පද්ධති මාර්ගයක් ගම මැදින් වැටී ඇති නමුත් ගම්මානයට විදුලිබල පහසුකම් ලැබී නොමැත. ගමෙහි එක් මායිමක පමණක් විදුලිබල පහසුව සැපයී ඇත.එහි ප්‍රතිශතය 8.1% කි.

2.2 රූ. සටහන.




## 2.7 සෞඛ්‍යය හා සනීපාරක්ෂක පහසුකම්.

ගම්වාසීන්ගේ සෞඛ්‍යය තත්ත්වය පිළිබඳ විමසීමේදී යහපත් සෞඛ්‍යය තත්ත්වයේ පසුවන පුද්ගලයන් ප්‍රමාණය 91.8% තරම් ඉහළ අගයක් ගන්නා බව හෙළිවිය. කෙසේ වුවද හේන් අස්වනු නෙළන කාලය තුළ කාන්තාවන් අතර කොන්දේ කැක්කුම, හිසේ කැක්කුම ආදී අසනීප තත්ත්වයන් බොහෝ විට පවතින නමුත් ඒවා සාමාන්‍ය තත්ත්වයන් සේ සිතා නොසලකා හැරීම හෝ ප්‍රතිකාරයක් ලෙස පැනඩෝල් වැනි වේදනානාශක පෙති පාවිච්චි කිරීම පමණක් සිදු කරන බව ඔවුන් සමග කරන ලද සාකච්ජාවලදී අනාවරණය විය. ප්‍රදේශයේ ජනගහනයෙන් නිරන්තරයෙන් පවතින ශාරීරික දුර්වලතාවන්ගෙන් පෙළෙන්නන් ප්‍රමාණය 7.1% වන අතර මානසික දුර්වලතාවන්ගෙන් පෙළෙන ප්‍රමාණය 1.1% වේ (2.17 සංඛ්‍යා සටහන). මානසික දුර්වලතාවන්ගෙන් පෙළෙන පිරිසෙන් පිරිමින් ප්‍රමාණය මෙන් දෙගුණයක් කාන්තාවන් වීම විශේෂයෙන් හඳුනාගත හැකි ලක්ෂණයකි.

2.17 සංඛ්‍යා සටහන

ගම්වාසීන්ගේ සෞඛ්‍යය තත්ත්වය - ස්ත්‍රී /පුරුෂ භාවය අනුව (නිකවැව ග්‍රා.නි.වසම)

| සෞඛ්‍යය තත්ත්වය | ස්ත්‍රී | | පුරුෂ | | මුළු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| යහපත් සෞඛ්‍යය තත්ත්වයක් සහිත. | 388 | 91.9 | 375 | 91.7 | 763 | 91.8 |
| ශාරීරික දුර්වලතා සහිත | 28 | 6.6 | 31 | 7.6 | 59 | 7.1 |
| මානසික දුර්වලතා සහිත | 06 | 1.4 | 03 | 0.7 | 09 | 1.1 |
| එකතුව | 422 | 100.0 | 409 | 100.0 | 831 | 100.0 |

*මූලාශ්‍ර - පාදක සමීක්ෂණය - 2003.*

සනීපාරක්ෂක පහසුකම්.

සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව සාකච්ඡා කිරීමේදී විශේෂයෙන් අවධානය යොමු වන වැසිකිළිවල ස්වභාවය සහ පානීය ජලය සපයා ගන්නා ප්‍රභවයන් යහපත් මට්ටමක පවතින බව පෙන්නුම් කරනු ලබයි. ගමේ නිවාස 125 ක ජල මුද්‍රිත වැසිකිළි භාවිතා කරන අතර ප්‍රතිශතයක් වශයෙන් සැළකුවහොත් 63.5% කි. නිවාස 72 ක (36.5%) වල වැසිකිළි භාවිතා වේ. ගමෙහි ජලය සපයා ගන්නා පොදු ප්‍රභවයන් ලෙස තමන්ගේ ළිං හැරුනු කොට පොදු ළිං 06ක්, නළ ළිං 12ක්, වැව් 05ක් හඳුනා ගන්නා ලදී.. ගමේ ජනගහනයෙන් 59.4% ක් නළ ළිං මාර්ගයෙන් තම පානීය ජලය සපයා ගන්නා අතර 30.5% ක් ළිං මාර්ගයෙන් ජල පහසුකම් සපයා ගනී. වැව් සහ ඇළ මාර්ගවලින් පානීය ජලය සපයා ගන්නා පිරිස 3.0% පමණ ප්‍රමාණයක් වේ (2.18.සංඛ්‍යා සටහන). කෙසේ වුවද නියං සමය එළඹෙන විට මෙම ජලය ලබා ගන්නා මූලාශ්‍ර බොහොමයක් සිඳී යන අතර ජලය සපයා ගැනීම සඳහා ඉමහත් වෙහෙසක් දැරීමට සිදු වේ.

2.18. සංඛ්‍යා සටහන :

ජලය සපයා ගන්නා මූලාශ්‍ර (තිකවැව ග්‍රා.නි. වසම).

| මූලාශ්‍රය | පානීය ජලය | | නෑමට ජලය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| තමාගේ ළිඳ | 22 | 11.2 | 20 | 10.2 |
| අසල්වැසි ළිඳ | 38 | 19.3 | 07 | 3.6 |
| නළ ළිඳ | 117 | 59.4 | 09 | 4.6 |
| ඇල | 05 | 2.5 | 16 | 8.1 |
| ගමේ වැව | 01 | 0.5 | 139 | 70.6 |
| මාර්ගයේ ඇති ජල කරාම | 01 | 0.5 | 0 | 0.0 |
| වෙනත් | 13 | 6.6 | 06 | 3.0 |
| එකතුව | 197 | 100.0 | 197 | 100.0 |

*මූලාශ්‍ර - පාදක සමීක්ෂණය - 2003*

ගමේ ජනගහනයෙන් 3/4 අධික ප්‍රමාණයක් (78.%) නෑම සඳහා ජලය සපයා ගන්නා ප්‍රභවය වන්නේ වැව් හෝ ඇල මාර්ග වේ. පානීය ජලය සපයා ගැනීමට භාවිතා කරනු ලබන මූලාශ්‍ර වෙත පවතින දුර පිළිබඳ විමසීමේදී ගමේ පවුල්වලින් 77% පමණ පානීය ජලය සපයා ගන්නා මූලාශ්‍රය කි.මී.1/4 ඇතුලත පිහිටා ඇති බව පෙනේ. පවුල්වලින් 45%කට ආසන්න ප්‍රමාණයක් කි.මී.1/4 ඇතුලත පිහිටි මූලාශ්‍රයකින් නෑම සඳහා ජලය සපයා ගනී. තවත් 40.6% ක් කි.මී.1/4-1/2 අතර දුරක් ඇතුලත නෑමට අවශ්‍ය ජලය ලබා ගනී. සමස්තයක් ලෙස ගම්වාසීන් තම ජල අවශ්‍යතා



පුස්තකාලය
LIBRARY
ගො.ගො.පර්,පු ආ
HARTI

සපුරා ගැනීමේදී දැඩි දුෂ්කරතාවන්ට මුහුණ නොදුන ද නියං සමයන්හිදී එසේ දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පානු ලබන බවත් ජලය සපයා ගැනීම සඳහා බොහෝ දුරක් ගමන කරන බවත් කියවෙයි.

2.19 සංඛ්‍යා සටහන

විවිධ අවශ්‍යතා සඳහා කුටුම්බයන් ජලය සපයා ගන්නා මූලාශ්‍රයට පවතින දුර (නිකවැවග්‍රා.නි.වසම).

| දුර (කි.මී.) | පානීය ජලය | | නෑමට ජලය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0<= 0.25 | 152 | 77.2 | 88 | 44.7 |
| 0.25<= 0.5 | 33 | 16.8 | 80 | 40.6 |
| 0.5 <=1.0 | 09 | 4.6 | 24 | 12.2 |
| 1.0 <=1.5 | 03 | 1.2 | 05 | 2.5 |
| 1.5 <=2.0 | 0 | 0.0 | 0 | 0.0 |
| 2.0 <=4.0 | 0 | 0.0 | 0 | 0.0 |
| 4.0 <= | 0 | 0 | 0 | 0.0 |
| එකතුව | 100.0 | 100.0 | 197 | 100.0 |

*මූලාශ්‍ර - පාදක සමීක්ෂණය - 2003.*

2.8 ග්‍රාමීය /ප්‍රජා සංවිධාන සහ ඒවායේ ස්වභාවය.

2.20 සංඛ්‍යා සටහන

**විවිධ සංවිධාන තුළ සහ ඒවායේ පවුල් නියෝජනය- නිකවැව වසම.**

| සමිතිය | නියෝජනය කරන පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| ගොවි සමිතිය | 107 | 48 |
| ග්‍රාම සංවර්ධන සමිතිය | 200 | 89 |
| වර්ල්ඩ් විෂන්- ජනතා සංවර්ධන පදනම | 225 | 100 |
| සමෘද්ධි සමිතිය | 187 | 83 |
| ධීවර සමිතිය | 06 | 03 |
| කලා සංගමය | 72 | 32 |

*මූලාශ්‍රය : පාදක සමීක්ෂණය -2003*

ඉහත දක්වා ඇති මූලික සමිතිවල සැළකිය යුතු පවුල් සංඛ්‍යාවක් නියෝජනය කරන බව පෙනේ. එයට අමතරව විවිධ කාර්යයන් හා සංවර්ධන කටයුතු සඳහා ගැමියන් මෙන්ම විවිධ ආයතන විසින් වරින්වර ඕනි කරනු ලැබූ සංවිධාන ගණනාවක් ඇති අතර ඒවා බොහොමයක් අකර්මන්‍යව පවතී. බොහෝ විට විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් පටන් ගන්නා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන පිටස්තර ආයතන එම සංවර්ධන කටයුතු හමාර කිරීමත් සමග එසේ වී ඇත.

[illegible] ප්‍රජා සංවිධාන [illegible] ක්‍රියාත්මක වීම හා රැස්වීම්වලට [illegible]
අපහසුතාවයක් පවතින බව ගමෙහි සංවිධානවල ක්‍රියාකාරීන් සමග සාකච්ජා කිරීමේදී අනාවරණය වූ අතරම විවිධ රාජ්‍ය නොවන සංවිධාන මඟින් ලබා දී ඇති ආධාර [illegible] සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලින් කුමන හෝ ආකාරයේ අධාරයක් ලබා ගැනීමේ "ආධාර මානසිකත්වයකට" ගම්වාසීන් බහුතරයක් හුරුවී ඇති බව නිරීක්ෂණය කළ හැකි විය. මෙයට අමතරව ගමෙහි බොහෝ සංවිධානවල පවුලේ පිරිමින් පමණක් සාමාජිකත්වය ලබා ඇති නමුත් බොහෝවිට ඒවායේ රැස්වීම් සඳහා සහභාගී වීම කාන්තාවන් විසින් සිදුකරන බව ඔවුන් හා සාකච්ජා කිරීමේදී අනාවරණය විය.

2.9 කාන්තාවන් හා තරුණයන්ගේ තත්ත්වය.

ගම තුල ක්‍රීඩා හා විනෝද පහසුකම් සඳහා කිසිදු පහසුකමක් නොමැතිවාක් මෙන්ම ඔවුන් තුළ පවතින හැකියාවන් දියුණු කර ගැනීමටද අවස්ථාවක් සැලසී නොමැත. ළමයින් තුළ වන කලා කෞශල්‍යතා වර්ධනය කිරීමේ අරමුණින් කලා සංගමයක් ආරම්භ කර ඇති නමුත් එමගින් හඳුන්වාදී ඇති ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපකරණ නොමැති බවද අනාවරණය විය.

ගමෙහි තරුණ පිරිස් තුලින් සම්ප්‍රදායික ගොවිතැනින් බැහැරව වෙනත් රැකියා සඳහා යොමුවීමේ රුචිකත්වයක් ඇති බව අනාවරණය විය. කෙසේ වුවද ඔවුහු විධිමත් වෘත්තීය පුහුණුවක් හෝ වෙනත් රැකියාවක් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා නොතිබුනහ.

## තුන්වන පරිච්ඡේදය
## ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 3.1 ආයතනික ප්‍රවේශය

අදාල වසමෙහි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී තෝරාගත් බෝගයට අදාළ (මුං ඇට හා කව්පි) සියළුම රාජ්‍ය ආයතනවල සම්පත් දායකත්වය ලබා ගැනීම අරමුණු කර ගනිමින් වැඩසටහන පිළිබඳ ඒවායෙහි නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගනු ලැබිණ. මේ අනුව දිස්ත්‍රික් ලේකම්, නියෝජ්‍ය කෘෂි කර්ම අධ්‍යක්ෂ, ගොවිජන සේවා හා සමෘද්ධි කොමසාරිස් වැනි අයත් ප්‍රාදේශීය නිලධාරීන් වන ප්‍රාදේශීය ලේකම්, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී, කෘෂිකර්ම උපදේශක යන අය සමග සාකච්ජා කරනු ලැබිණ.

වසම තෝරා ගැනීමේදී ද ඔවුන් සමග සාකච්ජා කර ඔවුන් විසින් නිර්දේශ කරනු ලැබූ ගම් කීපයක් ඇසුරින් වඩාත් යෝග්‍ය ගම තෝරා ගැනීම පර්යේෂණ කණ්ඩායම විසින් සිදු කෙරිණ.

### 3.2 ග්‍රාමීය ප්‍රවේශය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ඊළග කටයුත්ත වූයේ නිකවැව ග්‍රාම සේවා වසමට අදාළ නිලධාරීන්, සංවිධාන හා ප්‍රජාව දැනුවත් කිරීමයි.

පළමුව ග්‍රාම නිලධාරී, කෘෂි කර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, සමෘද්ධි නිලධාරී වැනි අය දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ මාර්ගයෙන් ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීමට පියවර ගනු ලැබිණ. දෙවනුව වසමෙහි ප්‍රජා සංවිධාන නියෝජිතයින් මෙන්ම ජනතාව පොදු ස්ථානයකට කැඳවා වැඩසටහනෙහි ස්වභාවය, අරමුණු හා ක්‍රියාත්මක ක්‍රමවේදය යනාදිය පිළිබඳ පුළුල් ලෙස සාකච්ජාවකට භාජනය කරමින් ඔවුන්ව පුළුල් ලෙස දැනුවත් කරන ලදී.

### 3.3 සහභාගීත්ව ගැමි විමසුම

ග්‍රාමීය සැලසුම් සැකසීමේ ක්‍රමෝපායයක් ලෙස සහභාගී ගැමි විමසුම් ක්‍රමය භාවිතයට ගනු ලැබිණ. මෙහිදී වසමෙහි ජනතාව පොදු ස්ථානයකට කැඳවා ඔවුන්ව දිනක් හෝ දෙකක් තුළදී තම ප්‍රදේශයෙහි ඇති සම්පත් හඳුනා ගැනීම සහ ඒවායෙහි ඇති වැදගත් කම අනුව ඒවා ප්‍රමුඛතා ගත කිරීම, එම ගැටළු විසඳීමට ගත යුතු ක්‍රියා මාර්ග හා එහිදී තමන්ට දායක වියහැකි ආකාරයත්, පිටස්තර ආයතන හා පාර්ශවකරුවන්ගෙන් ඉටුවිය යුතු කාර්යභාරය පිළිබඳවත් සාකච්ජාකර අදහස් ඉදිරිපත් කිරීම කෙරෙහි යොමු කරනු ලැබිණ.

ඒ අනුව සහභාගිත්ව ගැමි විමසුම මගින් හඳුනා ගනු ලැබූ හා ප්‍රමුඛතා ගත කරනු ලැබූ අධ්‍යයන ප්‍රදේශයෙහි පවත්නා ගැටළු 3.1 වගුවෙහි දැක්වේ.

3.1 වගුව

නිකවැව වසමෙහි ජනතාව විසින් හඳුනාගත් ගැටළු හා ඒවාට යෝජිත විසඳුම්

| | හඳුනා ගත් ගැටළු | යෝජිත විසඳුම් |
|---|---|---|
| 1 | වැව්වල ජල ප්‍රශ්නය | 1. දෙමෝදර වැවේ සිට නිකවැව දක්වා කපන ලද ඇළ මාර්ගය අතර මගදී හමුවූ ගල කඩා ඉවත් කිරීම<br>2. වැව් ප්‍රතිසංස්කරණය කිරීම. |
| 2. | යල කන්නයේ ඇතිවන ජල හිඟය | 1. දැනට කපා ඇති කෘෂි ළිං 17 ක් බැඳ ගැනීමට අධාර දීම හා අළුතින් ළිං කැපීම. |
| 3 | විදුලිය නොමැතිකම | 1. අසල්වැසි ගම් වෙත ඇති විදුලි සම්බන්ධතා මෙම ගම් වෙත දීර්ඝ කිරීම.<br>2. සහනදායි මුදලකට විදුලිය සැපයීම? |
| 4 | ගවයින් හා අලින්ගෙන් වගාවට හානි සිදුවීම | 1. ගව හිමියන්ට තණ බිම් ලබාදීම<br>2. ගව පට්ටි වෙනුවට වැඩි දියුණු කළ ගවයින් ලබාදීම<br>3. අලින් සඳහා විදුලි වැටක් සැකසීම. |
| 5 | තරුණ අයට රැකියා නැතිකම | 1. වෘත්තීය පුහුණුව ලබාදීම.<br>2. ස්වයං රැකියා සඳහා මූලික අධාර ලබාදීම |
| 6 | හොඳ තත්වයේ බීජ වර්ග නොමැතිකම | 1. සහතික කරන ලද හොඳ බීජ වර්ග ලබාදීම |
| 7 | පළතුරු හා වනවගා පැල ලබා ගැනීමට නොහැකිවීම | 1. අදාල පැල වර්ග සහන ක්‍රමයකට ලබාදීම |
| 8 | කෘෂි උපදෙස් අවශ්‍ය අවස්ථාවල ලබා ගැනීමට අපහසුවීම | 1. කෘෂි ව්‍යාප්ති නිළධාරීන්ගේ සේවය ගම තුළට ලබාදීම |
| 9 | හොඳ තත්ත්වයේ කිරි දෙනුන් නොමැතිකම | 1. හොඳ වර්ගයේ දෙනුන් හා පැටවුන් සහනදායක මිලකට ලබාදීම. |
| 10 | ධාන්‍ය හා වෙනත් නිෂ්පාදන සඳහා හොඳ වෙළඳ පලක් නැතිකම | 1. කෘෂි නිෂ්පාදන සඳහා අලෙවි මධ්‍යස්ථානයක් ඇරඹීම.<br>2. ආයතන සමග අලෙවි සම්බන්ධකම් ඇති කිරීම. |
| 11 | මාතෘ හා ළමා සායන පහසුකම් නොමැතිවීම | 1. ගම තුළ මාතෘ හා ළමා සායන මධ්‍යස්ථානයක් ඇති කිරීම. |
| 12 | ප්‍රවාහන පහසුකම් නොමැතිවීම | 1. අබලන් වී ඇති මාර්ග පිළිසකර කර ස්ථිර බස් සේවාවක් ලබාදීම. |

## 3.4 සැලසුම් සැකසීම

සහභාගීත්ව ගැමි විමසුම මගින් ලබා ගනු ලැබූ සියළුම තොරතුරු පදනම් කර ගනිමින් වඩාත් අර්ථවත් හා ප්‍රායෝගික සැලසුමක් සකස් කිරීම සඳහා තව දුරටත් ක්‍රියා කරනු ලැබූ අතර ඒ සඳහා ප්‍රදේශයෙහි තාක්ෂණික හා අනෙකුත් නිලධාරීන්ගේ සහයෝගය ලබා ගනු ලැබිණ. මේ යටතේ තණමල්විල ගොවිජන සංවර්ධන කාර්යාලයෙහි ප්‍රාදේශීය නිලධාරී, කෘෂි උපදේශක යනාදී නිලධාරීනුත් තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි සැලසුම්/ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී, තාක්ෂණික නිලධාරී යන අයත් ග්‍රාමීය සංවර්ධනයේ විශේෂිත අංශයන් නියෝජනය කරනු ලබන මුලස්ථාන සමෘද්ධි කළමනාකරු යනාදී අයත් සම්බන්ධ කර ගනු ලැබිණ. මෙහිදී ග්‍රාම නිලධාරී හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වැනි පහළම මට්ටමේ නිලධාරීන්ගේ සිට දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් හා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වැනි ඉහළම මට්ටමේ නිලධාරීන් දක්වා විවිධ මට්ටම්වල අයගේ සහයෝගය ලබා ගනු ලැබිණ.

## 3.5 සංවිධානාත්මක හා කළමනාකරණ ව්‍යුහය

ව්‍යාපෘතිය වසම තුළ ක්‍රියාත්මක කිරීමේ මූලික කළමණාකරණ ඒකකය ලෙස "ග්‍රාමීය සංවර්ධන කමිටුව" කටයුතු කරයි. ගමෙහි සමිති සමාගම්වල නායකයින් නියෝජනය වන ආකාරයෙන් ජනතාවගේ කැමැත්ත විමසා තෝරා පත් කර ගනු ලැබූ මෙම කමිටුවෙහි සභාපති ලෙස ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රාදේශීය නිලධාරිනිය කටයුතු කරන අතර ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමා අනුශාසක ලෙස කටයුතු කරයි. එහි ලේකම්වරිය වන්නේ ගමෙහි සංවිධාන අතරින් පත්කර ගත් තැනැත්තියකි. මෙම කමිටුව සංවර්ධන සැලසුම් ඒකකයක් ලෙසින් - මෙන්ම ව්‍යාපෘතිය ගමතුළ ක්‍රියාත්මක කිරීමේ වගකීම - දරන ආයතනය ලෙස ද ක්‍රියා කෙරේ.

ග්‍රාමීය සංවර්ධන කමිටුව පිහිටුවීමට අමතරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම පහසු කරවනු සඳහා පවත්නා ගොවි සංවිධාන වඩාත් ශක්තිමත් කිරීමට පියවර ගනු ලැබින. එසේ කරනු ලැබුයේ දේශන, කණ්ඩායම් හා පුද්ගලික සාකච්ජා යනාදිය අනුසාරයෙන් ග්‍රාමීය සංවර්ධනය සඳහා සංවිධාන ගතවීම හා එකමුතුව අත්වැල් බැඳ ගැනීමේ වැදගත්කම පිළිබඳව කරුණු පැහැදිලි කිරීම තුළිනි. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා ගනු ලැබූ තවත් පියවරක් වූයේ තෝරාගත් ග්‍රාමීය සංවිධාන නිලධාරීන් සඳහා නායකත්වය පිළිබඳ නේවාසික පුහුණුවක් ලබා දීමය. මේ සඳහා විවිධ සංවිධාන නියෝජනය වනසේ නිලධාරීන්/නිලධාරිනියන් තිදෙනෙකු තෝරා ගනු ලැබිණ.

ගම තුළ කුඩා කණ්ඩායම් බිහි කිරීම ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සංවිධානාත්මක ක්ෂේත්‍රයෙහි සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් අතරට ඇතුළත්වේ. එවැනි කුඩා කණ්ඩායම් බිහි කිරීම බොහෝ විට අවශ්‍යතාවයෙහි ස්වභාවය අනුව සිදු කරනු ලැබිය. උදාහරණ ලෙස ව්‍යාපෘතිය යටතේ කෘෂි ළිං ලබා දීමේදී පස්දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් වෙත ඒවා ලබාදීම අරමුණු කොට එවැනි කණ්ඩායම් බිහි කරනු ලැබිණ.

## 3.6 ජනතා සහභාගීත්වය ලබා ගැනීම හා ඔවුන් ක්‍රියාකාරීන් බවට පත් කිරීම

සංවර්ධන කටයුතු සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන කටයුත්තක් වූ බැවින් ඒ සඳහා හැකි සෑම පියවරක්ම අනුගමනය කරනු ලැබිණ. ඒ අනුව ගනු ලැබූ එක් පියවරක් වන්නේ යැපීම් මානසිකත්වය වෙනුවට ස්වශක්තිය මත දියුණු වීමේ වැදගත්කම හුවා දක්වමින් ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීමය. මේ සඳහා බාහිර නිලධාරීන් සම්බන්ධ කර ගනු ලැබූ දේශන මෙන්ම සාකච්ඡාවන් උපයෝගී කර ගනු ලැබිණ. මාසිකව රැස් වූ තාක්ෂණික කමිටුව මෙන්ම අවශ්‍ය විශේෂ අවස්ථාවන්හිදී රැස් කරනු ලැබූ මහා සභා රැස්වීම (ගමෙහි සියළු දෙනා රැස් කර පැවැත්වූ රැස්වීම) ඔස්සේ සංවර්ධන වැඩසටහන සඳහා වූ තීරණ ගැනීම් හා පසු විපරම් කිරීම කෙරෙහි ජනතාව උනන්දු කරවීම ඒ සඳහා ගනු ලැබූ දෙවන පියවරයි. විවිධ බෝග වගා ආදර්ශන පැවැත්වීම මෙන්ම පැළ, බීජ යනාදිය සහනදායී ලෙස ලබාදී ජනතාව වගාව සඳහා යොමු කරවා ගැනීම. ව්‍යාපෘතිය යටතේ ජනතා සහභාගීත්වය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබූ අනෙක් උපක්‍රමය වෙයි.

## 3.7 ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතු

සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කරුණු මත පදනම්ව ඒවා තෝරා ගැනීම හෝ ඒවා සඳහා ප්‍රමුඛත්වය දීම සිදු කරනු ලැබිණ.

2. ජනතාවගේ දැවෙන එමෙන්ම ඉක්මනින්ම විසඳිය යුතු ප්‍රශ්න
3. අදාළ ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය සම්පත් හෝ ශ්‍රමය ජනතාව ඇසුරින්ම සපයා ගත හැකි වීම.
4. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, උපකරණ, යෙදවුම් හා මූල්‍ය සම්පත් යම්කිසි ආයතනයකින් ලබාගත හැකිවීම.

නිකවැව වසම තුළ ව්‍යාපෘතිය පැවති වකවානුව තුළ ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන කටයුතු හා ඒවා සඳහා සහයෝගය දෙනු ලැබූ ආයතන පහත දැක්වෙන 3.2 වගුව මගින් ඉදිරිපත් කර ඇත.

## 3.2 වගුව

### නිකවැව වසම තුළ ක්‍රියාත්මක කල සංවර්ධන කාර්යයන්

| කාර්යයන්හි ස්වභාවය | කාර්යය | ඒ සඳහා මුදල්, උපකරණ, යෙදවුම්, තාක්ෂණ දැනුම ලබාදුන් හෝ උපකාර කළ ආයතන |
|---|---|---|
| 1. පුහුණු පාඨමාලා, වැඩමුළු, දේශන හෝ උපදේශන සේවා | 1. පාසැල් අධ්‍යාපනය අවසන් කල තරුණ, තරුණියන්ට වෘත්තීය පුහුණු පාඨමාලා තෝරා ගැනීම පිළිබඳ මූලික පුහුණුවක් ලබාදීම. | වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු මධ්‍යස්ථානය, තණමල්විල. |
| | 2. නවීන තාක්ෂණය අනුව වී වගා කිරීම පිළිබඳවත් වී වගාවේ නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීම පිළිබඳවත් ගොවීන් දැනුවත් කිරීම. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (කෘෂි උපදේශක) |
| 2. වගාවන් සහ වෙනත් කටයුතු පිළිබඳ ආදර්ශන | 3. බී.ජී. 300 වර්ගයේ බිත්තර වී ලබාදීම මගින් බිත්තර වී ආදර්ශනයක් සිදු කිරීම. | කෘෂි කර්ම දෙපාර්තමේන්තුව (කෘෂි උපදේශක) |
| | 4. කෙසෙල් වගා ආදර්ශන 3 ක් පිහිටුවීම මගින් කෙසෙල් වගාවට ගොවීන් පෙළඹවීමට කටයුතු කිරීම. | ගොවිජන සංවර්ධන හා කෘෂි කර්ම දෙපාර්තමේන්තුව (කෘ.ප.නි.ස) |
| 3. බීජ, ඇට, පැල වර්ග වෙනත් ද්‍රව්‍ය හා උපකරණ බෙදා දීම | 5. පරිසර සංරක්ෂණය සඳහා තේක්ක හා ඇත් දෙමට පැළ 2500 ක් ගම්මුන් අතර බෙදා දීම (ගෙදරකට තේක්ක පැල 8 ක් හා ඇත් දෙමට පැළ 2 බැගින්) | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මොණරාගල. |
| 4. වැව්, අමුණු, ඇලවේලි පාරවල් හා වෙනත් ප්‍රතිසංස්කරණ කටයුතු | උතුරා යන ජලය ගෙනයාම සඳහා දෙමෝදර වැවෙහි සිට නිකවැව දක්වා ඉදිකිරීමට ආරම්භ කර තිබූ එහෙත්-ගල් නිසා අඩක් පමණ නිමකර අතහැර- දමා තිබූ ඇල මුළුමනින්ම කපා නිම කිරීම. | සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව, මොණරාගල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තණමල්විල |
| 5. අළුතෙන් ඉදි කිරීම් | 7. යල් කන්නයේදී ගොවීන් වගා කටයුතුවලට යොමු කරවීම සඳහා කෘෂි ළිං 6ක් ඉදිකරවීම | කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තණමල්විල |
| 6. සංවිධාන, සමිති සමාගම්, කුඩා කණ්ඩායම් ගොඩ නැගීම හා ශක්තිමත් කිරීම | 8. ගොවි සමිති නිලධාරීන් දෙදෙනෙකුට හා කාන්තා සමිති නිලධාරිණියකට නායකත්ව පුහුණුවක් ලබාදීම මගින් ඔවුනුගේ සමිති වල කටයුතු කාර්යක්ෂම කරවීම. | හෙ.කො.ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| | 9. කෘෂි ළිං ලබා දී වගාවට යොමු කරවීම සඳහා පස්දෙනා බැගින් කුඩා කණ්ඩායම් 6ක් බිහි කිරීම | ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව (තණමල්විල මධ්‍යස්ථානය) |
| 7. ශ්‍රමදාන සහ වෙනත් කණ්ඩායම් කටයුතු | කාන්තාභිවර්ධනය සඳහා කාන්තා සමූහ ගොවිපලක් පිහිටුවීම. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (කෘෂි උපදේශක) |

# හතරවන පරිච්ඡේදය

## ව්‍යාපෘතියෙහි බලපෑම් සහ අරමුණු සඵල කර ගැනීම

### 4.1 සංවර්ධන කටයුතුවල බලපෑම

තිරසර වැඩසටහන යටතේ නිකවැව වසමෙහි ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන කටයුතු නිසා සිදුවූ නිමවුම්, එහි බලපෑම් සහ ප්‍රතිඵලත්, ව්‍යාපෘතියෙහි කෙටි කාලීන හා දිගු කාලීන අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා ඒවා කෙතරම් දුරට ඉවහල් වුවාද යන්නත් මෙම පරිච්ඡේදය මගින් විමසා බැලේ.

### 4.2 ව්‍යාපෘතියෙහි නිමවුම් සහ එහි බලපෑම්

ඒ ඒ සංවර්ධන කාර්යය නිසා සිදුවූ නිමවුම් මෙන්ම ඒවායෙහි කෙටි කාලීන හා දිගු කාලීන බලපෑම් 4.1 සිට 4.6 දක්වා ඇති වගු මගින් ඉදිරිපත් කර ඇත.

## 4.1 වගුව

## නිකවැව වසමෙහි සිදුකල ඒ ඒ සංවර්ධන කාර්යයන්හි නිමවුම් හා බලපෑම්

| පුහුණු පාඨමාලා, වැඩමුළු, දේශන හෝ උපදේශන සේවා (එහි නම ) | එහිදී ආවරණය කළ විෂයයන් | යෙදවුම් | එහි නිමවුම් පුහුණුව ලැබුවන් සංඛ්‍යාව | බලපෑම් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | කෙටි කාලීන | | | දිගු කාලීන හා අනාගත |
| | | | | දැනුම භාවිතා කල සංඛ්‍යාව | වැඩිවු ඵලදාව / රැකියා ප්‍රමාණය | වැඩි වු ආදායම | |
| 1. පාසැල් අධ්‍යාපනය අවසන් කල තරුණ, තරුණියන්ට වෘත්තීය පුහුණු පාඨමාලා තෝරා ගැනීම පිළිබඳ මූලික පුහුණුවක් ලබාදීම | වෘත්තීය පුහුණුවක් ලැබීමේ වැදගත්කම, වර්තමාන රැකියා වෙළඳපළෙහි ස්වභාවය, වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රයන් හා ඒ අනුව පුහුණුන් තෝරා ගැනීම | දැනුම | 30 | 15 | රැකියා 10 | පවුලකට මසකට රු. 4000/- | තවත් පිරිස් වෘත්තීය පුහුණුව ලබමින් සිටින අතර අනාගතයේදී ඔවුනට රැකියා මං සැලසේ. |
| 2. නවීන තාක්ෂණය අනුව වී වගා කිරීම පිළිබඳවත්, වී වගාවේ නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීම පිළිබඳවත් ගොවීන් දැනුවත් කිරීම | නවීන වී වර්ග භාවිතය, වල් හා කෘමි මර්ධනය, නිවැරදි පොහොර භාවිතය, නිෂ්පාදන මිල අඩුකර ගැනීම සඳහා පිදුරු ගොම වැනි කිබනික පොහොර භාවිතය | දැනුම | 20 | 15 | අක්. 10 බු. 10 | පවුලකට වසරකට රු. 2000/- (ඵලදාව වැඩිවීම හා නිෂ්පාදන වියදම අඩුවීම මත) | |

## 4.2 වගුව

### නිකවැව වසමෙහි සිදුකල ඒ ඒ සංවර්ධන කාර්යයන්හි නිමවුම් හා බලපෑම්

| වගාවන් හා වෙනත් කටයුතු පිළිබඳ ආදර්ශන | යෙදවුම් | නිමවුම් හා ප්‍රතිඵල | | බලපෑම් | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ආදර්ශන වලට කෙළින්ම සහභාගී වූ ගොවීන් සංඛ්‍යාව | ඒ යටතේ ව්‍යාප්ත වූ අක්කර ප්‍රමාණය | වැඩි වූ ඵලදාව | වැඩි වූ ආදායම | ආදර්ශනයට ගෙන අනුගමනය කල සංඛ්‍යාව | ව්‍යාප්ත වූ අක්. ප්‍රමාණය | වෙනත් ප්‍රතිඵල |
| 1. බී.ජී. 300 වර්ගයේ බීජ ලබාදීම මගින් බිත්තර වී ආදර්ශන සිදු කිරීම. | ගොවියකුට වී බුසල් 1 ක් නොමිලයේත්, බුසල් 2ක් මුදලටත් සැපයීම (සහනාධාරයේ මුළු වටිනාකම රු.5250/-) වී වගාව පිළිබඳ දැනුම | 07 | අක්. 07 | අක්. 1 ට බුසල් 20 | අක්. 1 ට කන්නයකට රු.3000/- | 05 | 03 | ආහාර සුරක්ෂිතතාව තහවුරු වීම. බිත්තර වී ප්‍රශ්නය යම්තාක් දුරට විසඳීම. |
| 2. කෙසෙල් වගා ආදර්ශන 3ක් පිහිටුවීම | ගොවියකුට ඇඹුල් කෙසෙල් පැල 100 බැගින් නොමිලයේ ලබාදීම*(සහනාධාරයේ මුළු වටිනාකම රු. 7500/-) කෙසෙල් වගාව පිළිබඳ දැනුම | 03 | අක්. 03 | තවම ඵලදාව ලබා නැත | | - | - | කෘෂි ළිං යටතේ සිටුවා ඇති කෙසෙල් ගොවීන්ගේ ආදායම අනාගතයේදී ඉහළ නැංවීමට බලපානු ඇත. |

* පුවාළු පැල 100 ක් ගොවියාගේ මුදලින් ගෙන සිටුවීම කොන්දේසියකි.

4.3 වගුව

| බීජ, ඇට, පැල වර්ග වෙනත් ද්‍රව්‍ය හා උපකරණ බෙදාදීම | යෙදවුම් | නිමවුම් හා ප්‍රතිඵල | | බලපෑම් | | |
|---|---|---|---|---|---|---|
| | | ව්‍යාප්ත වු අක්කර ප්‍රමාණය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | අනාගත නිෂ්පාදනය | අනාගත අපේක්ෂිත ආදායම | වෙනත් අනාගත බලපෑම් |
| 1. තේක්ක හා ඇත් දෙමට පැල ගම්මුන් අතර බෙදාදීම | තේක්ක පැල 08 ක් හා ඇත් දෙමට පැල 2 බැගින් පවුල් අතර බෙදා දීම (මුළු ප්‍රමාණය තේක්ක පැල 2000 ක් හා ඇත් දෙමට පැල 500 ක්)<br><br>වන වගාව පිළිබඳ දැනුම | අක්. 20 | පවුල් 240 | වසර 20 කදී තේක්ක ඝණ අඩි 40,000 හා ඇත් දෙමට ඝණ අඩි 10,000 | ලී මගින් වසර 20 කදී අද පවත්නා මිල අනුව ආදායම රු. දශ ලක්ෂ 40 | පරිසර සංරක්ෂණය |

4.4 වගුව

| වැව් අමුණු, ඇල වේලි, වැනි ප්‍රතිසංස්කරණ කටයුතු හා කෘෂි ළිං වැනි අළුත් ඉදි කිරීම් | යෙදවුම් | නිමවුම් හා ප්‍රතිඵල | | | බලපෑම් | | |
|---|---|---|---|---|---|---|---|
| | | ඉදිකිරීම් වල දිග, පළල හා ඒකක සංඛ්‍යාව | වැඩි වන වගා අක්. ප්‍රමාණය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වැඩි වූ නිෂ්පාදන | වැඩිවන ආදායම | වෙනත් |
| 1. දෙමෝදර වැවෙහි සිට නිකවැව දක්වා ජලය ගෙනයාමට භාගයක් කපා නවතා තිබූ ඇල කපා නිම කිරීම. | * රු. ලක්ෂ<br>* තාක්ෂණ දැනුම<br>* ප්‍රතිලාභී ශ්‍රමය | මීටර 300 ඇලක් | අක්. 60 | ගොවීන් 60 | වැඩි වූ නිෂ්පාදනය මහ් වී සහ යලේ අතිරේක බෝග | නිකවැව හා ගල් කොටුව වැව් වල මහ් ස්ථිර වී වගාවට ජල සැපයුම හා යලෙහි අතිරේක බෝග වගාවට ජලය සැපයුම මගින් රැකියා හා ආදායම් සුරක්ෂිත කෙරේ. | ආහාර සුරක්ෂිතතාව, ඉහළ සමාජ තත්ත්වය. |
| 2. කෘෂි ළිං ඉදි කරවීම | * රු. ලක්ෂ 4<br>* තාක්ෂණ දැනුම<br>* ප්‍රතිලාභී ශ්‍රමය | කෘෂි ළිං 06 | අක්. 15 | ගොවීන් 30 | යලෙහි අතිරේක බෝග නිෂ්පාදනය. | යලෙහි අතිරේක බෝග වගාව මගින් රැකියා හා ආදායම් සුරක්ෂිත කෙරේ. | ආහාර සුරක්ෂිතතාව, ඉහළ සමාජ තත්ත්වය. |

4.5 වගුව

| සංවිධාන, සමිති, සමාගම්, කුඩා කණ්ඩායම්, ගොඩනැගීම හා ශක්තිමත් කිරීම | යෙදවුම් | නිමවුම් හා ප්‍රතිඵල | | බලපෑම් | |
|---|---|---|---|---|---|
| | | ගොඩ නැගූ හෝ ශක්තිමත් කල සංවිධාන / කන්ඩායම් | ඒ සඳහා කෙලින්ම සහභාගී කරවා ගත් ගොවීන් / පුද්ගලයින් ගණන | අත්කර ගත් ප්‍රයෝජන | ඕනාගත ප්‍රයෝජන |
| 1. ගොවි සමිති නිලධාරීන් දෙදෙනෙකුට හා කාන්තා සමිති නිලධාරිනියකට නායකත්ව පුහුණුවක් ලබාදීම මගින් එම සමිති ශක්තිමත් කිරීම. | * දැනුම හා උපදෙස්<br>* රු. 20,000 | 04 | 03 | ඔවුන් නියෝජනය කරනු ලබන සංවිධාන වඩාත් කාර්යක්ෂම හා සංවිධානාත්මක බවට පත්වීම ඔවුන් අතින් සිදුවිය. | ජල කළමනාකරණය, අලෙවි කරණය වැනි සාමුහික කටයුතු සංවිධානය |
| 2. කෘෂි ළිං ලබාදීම සඳහාත් ඒ යටතේ වගා කටයුතු සඳහාත් කුඩා කණ්ඩායම් ගොඩනැගීම | * දැනුම හා උපදෙස්<br>* රු. 10,000 | 06 | 30 | කෘෂි ළිං ලබාදීමේදී අවම මුදල් ප්‍රමාණයක් (රු.65,000/-) දීම මගින් ඊට වඩා වටිනා (රු. 100,000/) වැඩ ප්‍රමාණයක් කන්ඩායම් මගින් ඉටු කරවා ගත හැකිවිය. | කෘෂි ළිං ජලය මනා ලෙස කළමනාකරණය මගින් වැඩි ප්‍රතිඵල ලැබීම. |

## 4.6 වගුව

| ශ්‍රමදාන සහ වෙනත් කණ්ඩායම් කටයුතු | යෙදවුම් | නිමවුම් හා ප්‍රතිඵල | | බලපෑම් | | |
|---|---|---|---|---|---|---|
| | | වගා කල අක්. ප්‍රමාණය | සහභාගී වු කාන්තාවන් ගණන | වැඩි වූ නිෂ්පාදනය | වැඩි වු ආදායම | වෙනත් |
| 1. කාන්තාභිවර්ධනය සඳහා කාන්තා සමූහ ගොවිපලක් පිහිටුවීම. | * රතුළූණු බීජ කිලෝ 200 (වටිනාකම රු. 10,000)<br><br>* කෘෂි උපදෙස් | අක්. 01 | 07 | කලට වේලාවට වගා නොකිරීමත් නියම පර්දි උපදෙස් නොපිලිපැදීමත් නිසා වගාව පාළු විය. | - | කණ්ඩායම් සහයෝගීතාව වර්ධනය වීම |

## 4.3 කෙටි කාලීන හා දිගු කාලීන ව්‍යාපෘති අරමුණු ඉටුවීම

මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරනු ලැබූ දිගු කාලීන අරමුණු පමණක් නොව කෙටි කාලීන අරමුණු පවා හරි හැටි මල්ඵල ගන්වා ගැනීම සඳහා සෑහෙන කාලයක් ගතවනු ඇත. වැඩසටහන සඳහා භාවිතයට යොදා ගත හැකි වූ මූල්‍ය හා අනෙකුත් සම්පත් වල ස්වභාවය හා ප්‍රමාණය, ඒවා භාවිතය සඳහා ලැබුණු සහ භාවිතා කළ අවස්ථාව, ඒවා කිරීමේදී අනුගමනය කරනු ලැබූ උපක්‍රම යනාදිය මත මෙය පදනම් ව ඇත. උදාහරණ ලෙස සම්පත් භාවිතයේදී යොදා ගනු ලැබූ ප්‍රධාන උපක්‍රමයක් වන බෝග හා පැළ වගා ආදර්ශන පිහිටුවීම ගෙන බලන විට මුලින් එය අනුගමනය කළ අය ලබා ගන්නා සාර්ථක ප්‍රතිඵල අත්විඳීමට ලැබීමෙන් පසු තවත් පිරිසක් එය අනුගමනය කිරීම තුළින් වැඩි පිරිසකට එහි ප්‍රතිඵල අත්විඳිමට හැකි වේ. මේ ආකාරයට එහි ප්‍රතිඵල වැඩි පිරිසක් අතරට ගලා යාම සඳහා සෑහෙන කලක් ගත වේ.

නිකවැව තිරසර වැඩසටහන යටතේ ඒ ආකාරයෙන් වී හා කෙසෙල් වගා ආදර්ශන පටන් ගනු ලැබූ අතර වී වගාව කෙටි කාලීන එකක් නිසා එහි ප්‍රතිඵල වැඩි පිරිසකට ඉක්මනින් අත්විඳ ගැන්මට හැකිවිය. එහෙත් කෙසෙල් වගාව තරමක් දිගු කාලීන එකක් නිසා එහි ප්‍රතිඵල වැඩි පිරිසක් අතරට කාන්දු වීම සඳහා වසර කිපයක් යා හැකිය. 2003 මහ කන්නය තුළ වී වගාව සඳහා උනන්දු කළ ගොවීන් 7 දෙනෙකු ඉන් සාර්ථක ප්‍රතිඵල ලබාගත් අතර ඊට පසු යල් කන්නය තුලදී ඔවුන් අනුගමනය කරමින් වී වගාව කළ තවත් ගොවීහු 3 දෙනෙක් වූහ. ඊළග මහ කන්නය වන විට එය අනුගමනය කරන්නන්ගේ හා වගා ප්‍රතිලාභ අත්විඳින්නන්ගේ ප්‍රමාණය තවත් වැඩි වනු ඇත.

කෙසෙල් වගා ආදර්ශන සඳහා ගොවීන් තිදෙනෙක් සහභාගී වූහ. එහෙත් එහි ප්‍රතිඵල ප්‍රදර්ශනය කර අනෙකුත් ගම් වාසීන් ද ඒ වෙත ආකර්ශනය කර ගැනීම සඳහා වසර 1 1/2 ක් වත් අවශ්‍ය වනු ඇත. කාන්තා කණ්ඩායමක් සම්බන්ධ කර ගනිමින් පටන් ගනු ලැබූ සමූහ ගොවිපල තුළ එළුණු වගාව ව්‍යාප්ත කරලීම සඳහා උනන්දු කළත් කලට වේලාවට වගා කිරීම සඳහා හා සාත්තු කිරීමට ඔවුන් සමත් නොවීම නිසා එය අසාර්ථකත්වයට පත්විය. එනිසා එහි ප්‍රතිලාභයන් කිසිවකුට අත් නොවිය.

පාසැල් අධ්‍යාපනය අවසන් කළ තරුණ තරුණියන් සඳහා පැවැත්වූ වෘත්තීය පුහුණු වීම් තෝරා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා තිස්දෙනෙකු පමණ සහභාගී වූ අතර ඒ යටතේ ක්ෂණිකවම දසදෙනෙකුට රැකියා සපයා ගැනීමට හැකිවිය. තවත් කීපදෙනෙකුට විවිධ පුහුණු අවස්ථා සලසා ගැනීමට හැකිවිය. මෙසේ පුහුණු වන්නන්ට ඉදිරියේදී රැකියා වෙළඳපලට ප්‍රවිෂ්ඨ වීම සඳහා අවස්ථාව සැලසේ.

වන වගා ව්‍යාපෘතිය යටතේ වසමෙහි සියළුම පවුල්වලට (පවුල් 230 පමණ) තේක්ක හා ඇත් දෙමට පැළ බෙදා දෙනු ලැබූ නමුත් එහි ප්‍රතිඵල නෙලා ගැනීම සඳහා වසර 20 ක් පමණ ගතවේ.

ඉහත දැක්වූ සියළුම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලැබුයේ වැඩි වශයෙන්ම හෙ.කො.ගො.ප.පු කිරීමේ ආයතනය මගින් නිකවැව ව්‍යාපෘති ප්‍රදේශය සඳහා වෙන්කර තිබූ මුදල් යොදා ගැනිමෙනි. මෙහිදී කෘෂි හා වන වගා කටයුතු සම්බන්ධ පුහුණු කටයුතු සඳහාත් වෘත්තීය පුහුණු පාඨමාලාවන් තෝරා ගැනීම පිළිබඳව පුහුණු කිරීම

සඳහාත් ප්‍රදේශයේ අනෙකුත් ආයතනවල සහයෝගය ලැබුන අතර වන වගා කටයුතු සඳහා නොමිලයේ පැළ බෙදාදීම සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබාදෙනු ලැබින. ඒ හැරුණු විට වෙනත් ආයතන වලින් මූල්‍ය හා ද්‍රව්‍යමය සහයෝගය ලබාදීමක් ව්‍යාපෘතියෙහි මුල් වකවානුවේදී සිදු නොවිනි. මෙය ව්‍යාපෘතියෙන් අපේක්ෂිත කෙටි කාලින ප්‍රතිඵල ඉක්මනින් සපුරා ගැනීම සඳහා බාධාකාරී ලෙස බලපෑ කරුණක් විය. නමුත් ව්‍යාපෘතිය අවසාන භාගයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් හා සමෘද්ධි අධිකාරිය මගින් නිකවැව වසමෙහි ජල අවශ්‍යතා සැපිරීමට යටිතල පහසුකම් ලබාදීම සඳහා සෑහෙන මුදල් ප්‍රමාණයක් ලබාදෙනු ලැබින. මේ යටතේ ගමෙහි පිහිටි එක් වැවකින් උතුරා යන ජලය තවත් වැව් දෙකකට ගෙනයාම සඳහා සැලසුම් කළ එහෙත් නිමවා තිබු කිලෝ මීටර් එකක පමණ වූ ඇලක ඉතිරි කොටස නිම කිරීම සඳහා රුපියල් 525,000.00 ක මුදලක් වෙන් කළ අතර එය මේ වන විට ප්‍රදේශයේ සමෘද්ධි බලකායෙහි සහයෝගයෙන් නිමවා තිබේ. එහෙත් එමගින් ප්‍රතිලාභ අත්විදීම සඳහා ඊළඟ මහ කන්නය (2004 මහ කන්නය) තෙක් බලා සිටීමට සිදුවේ.

ඉහත දැක්වූ ආකාරයට කෘෂි ළිං 6 ක් සෑදීම සඳහා ව්‍යාපෘතියෙහි අග භාගයේදී කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂ 4ක මුදලක් ලැබුන අතර එමගින් අදාළ කටයුත්ත මේ වන විට නිමවා ඇතත් එමගින් අපේක්ෂිත ප්‍රතිඵල භුක්ති විඳිය හැක්කේ ලබන යල් කන්නයෙන් (2004 යල කන්නය) පසුවය.

ඉහත දැක්වූ ආකාරයට මෙම ව්‍යාපෘතිය මගින් වසමෙහි ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කටයුතු වල ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා තවත් කාලයක් ගතවනු ඇත. එසේ නමුත් ව්‍යාපෘතිය යටතේ මුල් වකවානුව තුළදී ඉටු කරනු ලැබූ සංවර්ධන කටයුතු මගින් අපේක්ෂිත අරමුණු විශාල වශයෙන් නොවුවත් යම්කිසි ප්‍රමාණයකට අත්කර ගැනීමට හැකිවූ අතර ඒවා අංක 4.7 වගුව මගින් ඉදිරිපත් කර ඇත.

4.7 වගුව

ව්‍යාපෘතිය යටතේ කොටිකාලීන අරමුණු ඉටුවී ඇති ප්‍රමාණය

| | | |
|---|---|---|
| **ඵලදායිතා වර්ධනය** | | |
| | ඵලදායිතාව අක්. 10 | ප්‍රතිලාභීන් ගණන |
| ▪ නවීන තාක්ෂණය අනුව වී වගා කිරීම පිළිබඳව දැනුවත් කිරීම | බුසල් 10 | 15 |
| ▪ බිත්තර වී ආදර්ශන | බුසල් 20 | 12 |
| **රැකියා වර්ධනය** | | |
| | රැකියා ලැබුනු සංඛ්‍යාව | |
| පාසැල් අධ්‍යාපනය හමාර කල අයට වෘත්තීය පුහුණුවීම් හඳුනා ගැන්ම පිළිබඳ පුහුණුව | 10 | |
| **ආදායම් වර්ධනය** | | |
| | ආදායම වැඩි වූ ප්‍රමාණය | ප්‍රතිලාභී පවුල් ගණන |
| නවීන තාක්ෂණය අනුව වී වගා කිරීම පිළිබඳ දැනුවත් කිරීම | වසකරකදී පවුලකට රු. 2000/- | 15 |
| බිත්තර වී ආදර්ශන | කන්නයකදී පවුලකට රු. 3000/- | 12 |
| පාසැල් අධ්‍යාපනය හමාර කළ අයට වෘත්තීය පුහුණුවීම් හඳුනා ගැන්ම පිළිබඳ පුහුණුව | පවුලකට මසකට රු. 4000/- | 10 |
| **ආහාර සුරක්ෂිතතාවෙහි වර්ධනය** | | |
| පරිභෝජනය සඳහා පවතින ආහාර ප්‍රමාණයේ වර්ධනය | වසරකදී වසමෙහි වී ප්‍රමාණය බුසල් 390 කින් වැඩිවීම | |
| ආහාර ලබා ගැනීමේ හා මිලදී ගැනීමේ හැකියා වර්ධනය | පවුල් 37 | |
| **ජනතා සහභාගීත්වය ලබා ගැනීම** | | |
| ගැටළු හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා තීරණ ගැනීමේ සහභාගීත්වය | වසමේ පවුල් වලින් 60% | |



පුස්තකාලය
LIBRARY
ශ්‍රී ආ

පස්වන පරිච්ඡේදය

# පාඩම්, අත්දැකීම් හා ගැටළු

## 5.1 පාඩම් හා අත්දැකීම්

ග්‍රාමීය හා සුළු ගොවි ක්ෂේත්‍රයන්හි කාලයක් තිස්සේ කැකෑරෙමින් පැවති ප්‍රශ්න හා ගැටළු සඳහා විසඳුම් සලසා ගැනීම සඳහා විශේෂිත වූ ක්‍රමෝපායයක් වෙත නැඹුරු වූ එනම් ප්‍රායෝගික ලෙස ඒවාට විසඳුම් සෙවීමේ ආදර්ශන බිහි කර ඒ තුළින් සෙසු ජනතාවත් ඒ කෙරෙහි යොමු කරවා ගැනීම සඳහා කැපවූ තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන ග්‍රාමීය කෘෂි සංවර්ධනය සම්බන්ධ පාඩම් හා අත්දැකීම් සෑහෙන ප්‍රමාණයක් ලබා දීමට සමත්ව ඇත.

මෙමගින් පසක් කර ගැනීමට හැකිවූ වැදගත් පාඩමක් වන්නේ ග්‍රාමීය කෘෂි ක්ෂේත්‍රයෙහි පවත්නා බොහොමයක් ප්‍රශ්න සඳහා විසඳුම් ඒ තුළින්ම සොයා ගැනීමට ඉඩකඩ ඇති බවය. එම ක්ෂේත්‍රයෙහි පවත්නා බොහොමයක් භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා කාර්යක්ෂමව භාවිතයට ගෙන ඇති බවක් නොපෙනේ. එසේ භාවිතයට නොගත් සම්පත් එකිනෙක සම්බන්ධව විමසා බලමින් ඒවා මනා කළමනාකරණ ව්‍යුහයකට පත්කර කාර්යක්ෂම ලෙස භාවිතයට ගනු ලබන්නේ නම් එම ක්ෂේත්‍රයේ නිෂ්පාදන, ආදායම් හා ජීවන තත්ත්වයන් සෑහෙන මට්ටමකට ඉදිරියට ගතහැකි බව පෙනේ. නිකවැව වසමෙහි අත්හදා බැලූ වී ආදර්ශන මගින් මෙන්ම කෘෂි ළිං සහ වාරි ඇල කැපීමේ වැඩසටහන මගින් මෙය තව දුරටත් පැහැදිලි වේ. වී ආදර්ශන ඔස්සේ නව වී වර්ග භාවිතය මගින් දැනට ලබා ගන්නා ප්‍රමාණයට වඩා අස්වැන්නක් ලබා ගත හැකි බවත්, ප්‍රදේශයේ ඇති බහුල එහෙත් ඵලදායී ලෙස ප්‍රයෝජනයට නොගත් සම්පතක් වන ගොම මෙන්ම පිදුරුත් කුඹුරුවලට යෙදීම තුළින් රසායනික පොහොර සඳහා යන වියදම අඩුකර ගනිමින් වී නිෂ්පාදනයෙන් වැඩි ලාභයක් අත්කර ගතහැකි බවත් සුදුසු තැන් බලා කෘෂි ළිං ඉදි කිරීම තුළින් දැනට ප්‍රයෝජනයට නොගැනෙන සම්පතක් වන භූ ගත ජලය යළ කන්නයේදී සෑහෙන පිරිසකගේ ජීවන මාර්ගය සලසා ගැනීම සඳහා යොදා ගත හැකි බවත් ප්‍රත්‍යක්ෂ විය. මෙම වැඩසටහන යටතේ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා ජනතාව හැකි සෑම අයුරකින්ම සහභාගී කරවා ගැනීම තුළින් පවත්නා සීමිත සම්පත් වඩාත් කාර්යක්ෂම හා ඵ‍ලදායී ප්‍රයෝජන වන ආකාරයට භාවිතයට ගැනීමට අවස්ථාව උදා විය. ප්‍රදේශයේ ප්‍රශ්න හඳුනා ගැනීම හා ප්‍රමුඛතා ගත කිරීම, සැලසුම් සැකසීම, තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් යනාදී සංවර්ධනයේ සෑම අවස්ථාවකදීම ජනතා සහභාගීත්වය උපරිම ලෙස භාවිතයට ගැනීම තුළ ප්‍රමුඛත්වය දිය යුතු ගැටළු විසඳා වැඩි පිරිසකට ප්‍රතිලාභ අත්කර දීමටත් පිටතින් ලැබෙන සම්පත් වඩාත් ඵලදායි ලෙස ගමේ සංවර්ධනය සඳහා යොදා ගැනීමටත් අවස්ථාව සැලසුන බව කිව යුතුය. මෙහිදී කෘෂි ළිං ඉදිකිරීමේදී වැඩසටහන උදාහරණයක් ලෙස ගෙන බලන්නේ නම් මේ කරුණ තව දුරටත් පැහැදිලි වනු ඇත. ගමේ සංවර්ධනය සඳහා රුපියල් ලක්ෂ 4 ක මුදල කෘෂි ළිං ව්‍යාපෘතියක් වැන්නකට යෙදීම තුලින් 30 දෙනෙකුට පමණ ජීවන වෘත්තීය සලසා ගතහැකි බව පෙන්වා දුන් ගම්මු ඉදි කිරීමට සුදුසු (තාක්ෂණික වශයෙන් ගැළපෙන) ප්‍රදේශ මොනවාද යන්නත් පිළිබඳ විනිශ්චය කරනු ලැබීන. ඒ අනුව රුපියල් ලක්ෂයක් පමන වටිනා ළිඳක් රු 60-70 දාහක් පමණක් ව්‍යාපෘතිය මගින් වැය කිරීමෙන් හා ප්‍රතිලාභීන්ගේ ශ්‍රමය යොදවා ගැනීමෙන් නිම කරවා ගැනීමට හැකි විය.

## 5.2 ප්‍රශ්න හා ගැටළු

අදාළ වැඩසටහන නිකවැව ග්‍රාමය තුළ ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ඇතැම් ප්‍රශ්න හා ගැටළු ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්කරගැනීම අඩපණ කිරීමට සමත් විය. ඒවා නම්

1. ප්‍රදේශයේ සියළු රාජ්‍ය ආයතනවල අනුග්‍රහය ව්‍යාපෘතියට නොලැබීම. මේ තත්ත්වය දේශපාලනික ව්‍යුහය, සමාජීය වටපිටාව හා වැරදි ආකල්ප යනාදී කරුණුවල බලපෑමෙන් වූවක් බව පෙනේ. පවත්නා දේශපාලනික ව්‍යුහය අනුව ප්‍රදේශය අයත් වන්නේ විරුද්ධ පක්ෂය යටතේ පාලනය වන ඌව පළාත් සභාවටය. මධ්‍යම ආණ්ඩුව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වලට පළාත් සභාව යටතේ පාලනය වන ආයතනවලින් ප්‍රමාණවත් සහායක් නොලැබේ. මේ නිසාම මධ්‍යම රජයේ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වූ තිරසර වැඩසටහන පළාත් සභාව යටතේ පාලනය වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් උපදෙස් හැරුණු කොට වෙනත් සහයෝගයක් ලබා ගැනීම දුෂ්කර විය. ප්‍රදේශයේ භෞතික හා සමාජ පරිසරය ගැන විමසා බැලීමේදී ගමන් බිමන් හා සේවා පහසුකම් අතින් මොණරාගල මහත් දුෂ්කරතා ඇති ප්‍රදේශයක් බව ප්‍රකටය. ඒ නිසාම වෘත්තීයමය දඬුවම් වලට ලක් වූ නිළධාරීන් පත්කර එවන ප්‍රදේශයක් ලෙස එම ප්‍රදේශය ප්‍රකටය. එවැනි නිළධාරීන්ගෙන් කාර්යක්ෂම සේවයක් අපේක්ෂා කළ නොහැකිවීම ව්‍යාපෘතිය මුහුණ පෑ ප්‍රබල ගැටළුවකි. මේ නිසාම ඇතැම් නිළධාරීන් හා ආයතන අතර ගොඩනැගී ඇති අසමගිය ව්‍යාපෘතියටද බලපෑම් කළේය.

2. ජනතා ගැටළු සඳහා විසඳුම් ලබාදීමට හා ඇතැම් යෝජනා ක්‍රියාත්මක කරවීමට සම්පත් හා මුදල් නොමැතිකම මුහුණ දුන් ප්‍රබල ප්‍රශ්නයක් විය. ඔවුන්ගේ ප්‍රශ්න අති විශාල වූ අතර යෝජනාද සෑහෙන ගණනකි. එහෙත් ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සම්පත් තිබුනේ ඉතා සීමිත වූ ප්‍රමාණයකි. වෙනත් ආයතන වලින් ලැබුනු සම්පත් ප්‍රමාණය ඉතා අල්පය. ඒ නිසා ව්‍යාපෘතිය මගින් මුදල් වැය කර සිදු කළ ආදර්ශන වැනි කටයුතු නව මං හා දැනුම ව්‍යාප්ත කිරීම සඳහා මිස එමගින් ලබාදුන් අස්වැන්න, ආදායම හෝ රැකියා ප්‍රමාණය ගම තුළ ප්‍රබල සමාජ ආර්ථික වෙනසක් ඇති කරලීමට තරම් ප්‍රමාණවත් නොවීය.

3. ග්‍රාමයෙහි වැසියන් තුළ පැවති අලසකම, නිද්‍රාශීලී බව හා යැපුම් මානසිකත්වය වැනි වැරදි ආකල්ප හා පසුගාමී හැසිරීම් රටාව ද, ව්‍යාපෘතිය මගින් ගනු ලැබූ උත්සාහයන්හි නියම ඵල නෙලා ගැනීම අවහිර කරවන කරුණු විය.

## හයවන පරිච්ඡේදය
## නිගමන හා යෝජනා

### 6.1 නිගමන

ග්‍රාමීය කෘෂි ක්ෂේත්‍රය තුළ පසුගිය කාලය තුළ අත්දැකීමට තිබු පසුගාමී වර්ධනය වෙනුවට "ආදර්ශන ගම්මාන බිහිකිරීමේ" එළඹුම ඔස්සේ එය නැවතත් නවෝදයකට පත්කර සමෘද්ධිමත් ගොවිජන සමාජයක් බිහි කිරීම සඳහා ආරම්භ කරනු ලැබු තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන තවමත් එහි කෙටිකාලීන හා දිගුකාලීන අරමුණු පුළුල්ව සපුරා ගැනීමට තරම් කාලයක් ගතකර නැතත් එමගින් ග්‍රාමීය සංවර්ධනය සඳහා වැදගත් වන පාඩම් හා අත්දැකීම් සමුදායක් මේ වනවිට අපවෙත දායාද කර ඇතැයි කිව හැක.

ග්‍රාමීය ක්ෂේත්‍රයෙහි ගැටළු, සම්පත් හා හැකියා මනාව හඳුනා ගැන්මෙන් පසු සහභාගීත්ව හා ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ සකස් කරන්නාවු මනා සැලසුමකින් හා එය ක්‍රියාත්මක කරන්නාවු කාර්යක්ෂම වු කළමනාකරණ ඒකකයක් මගින් එම ක්ෂේත්‍රයෙහි නිෂ්පාදන ඵලදායීතාව හා ආදායම වැඩිකළ හැකි බව නිකවැව තිරසර සංවර්ධන ආදර්ශනයෙන් ඒත්තු යයි. දැනට පවත්නා නිෂ්පාදන කටයුතු පිළිබඳව පවා ක්‍රමවත්ව විමසා බැලීමෙන් හා ඒවායෙහි යම් යම් තාක්ෂණික හා කළමනාකරණ වෙනස්කම් සිදු කිරීමෙන් ඒවායෙහි ඵලදායීතාවය හා ආදායම වැඩිකළ හැකි බව පසක් වේ.

ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය සංවර්ධනය සඳහා විවිධ අයුරින් දායක වන ගොවීන් හා නිළධාරීන් එකිනෙකට සමීපව කටයුතු කිරීමට සැලැස්වීම හා සංවර්ධන කටයුතු සඳහා ගොවි ජනතාවගේ සහභාගීත්වය ඉතා උසස් කොට සැලකීම මෙන්ම ඒ සඳහා ක්‍රමෝපායයන් යෙදීම තුළ ගොවි ජනතාව මහත් උනන්දුවකින් හා උද්‍යෝගයකින් ව්‍යාපෘතිය සඳහා සහභාගී වීමක් පෙන්නුම් කළහ.

මෙම වැඩසටහන යටතේ කෘෂිකර්මය සඳහා භාවිත ඇතැම් නව තාක්ෂණික උපක්‍රම හා භාවිතයන් ගම වෙත හඳුන්වාදීම නිසා සම්ප්‍රදායානුකූලව පවත්වාගෙන ආ කෘෂිකාර්මික කටයුතු නව තාක්ෂණය හා සම්බන්ධ කරමින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙසට කිරීම සඳහා ජනතාව තුළ පෙළඹුමක් ඇති කර ඇති බව ද පෙනේ.

### 6.2 යෝජනා

මෙම වැඩසටහන මගින් ලබා ගත් අත්දැකීම් පදනම් කර ගනිමින් ග්‍රාමීය කෘෂිකර්මය හා ජනතාවගේ ආර්ථික තත්ත්වය දියුණු කිරීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන්නෙමු.

1. සංවර්ධන උපක්‍රම, තාක්ෂණික ක්‍රම හා භාවිතයන්හි ඉහළ ප්‍රතිඵල පිළිඹිබු වන ආකාරයේ ආදර්ශන ග්‍රාමීය පෙදෙස්හි නිරන්තරව පවත්වාගෙන යාම මගින් අනෙකුත් ජනතාව එවැනි ආදර්ශන මගින් පිළිබිඹු කරනු ලැබු සංවර්ධන කටයුතු සඳහා පෙළඹවිය යුතුය.
2. හැම දිස්ත්‍රික්කයකම සියළුම කෘෂිකාර්මික නිලධාරීන්ගේ සහයෝගය ඇතිව සංවර්ධනය විවිධ අංශයන් නියෝජනය වන ආකාරයේ ආදර්ශන ඇතුළත් ආදර්ශ ගම්මාන දෙකක් හෝ තුනක් ස්ථාපිත කළයුතු අතර ඒවා අදාල දිස්ත්‍රික්කයේ ඉහළම නිලධාරීන්ගේ අධීක්ෂණයට ලක්විය යුතුය.

ඇමුණුම 01 :
1 වගුව

## තිරසාර සංවර්ධන ගම්මාන ව්‍යාපෘතිය (R-290)
## ක්‍රියාත්මක වන ප්‍රදේශ

| ව්‍යාපෘති සංකේතය | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ගොවිජන සේවා බල ප්‍රදේශය | තෝරා ගත් ග්‍රාම නිලධාරී වසම | ගම් | පදනම් කරගත් බෝගය |
|---|---|---|---|---|---|---|---|
| R- 290/01 | උතුරු මැද | පොළොන්නරුව | මැදිරිගිරිය | ගල්අමුණ | සංසුන්ගම | 1.සංසුන්ගම | වී (මහා වාරි) |
| R- 290/02 | ඌව | මොණරාගල | තණමල්විල | තණමල්විල | නිකවැව | 1.නිකවැව<br>2.නිකආර<br>3.වීරපුරගම | මුං, කව්පි |
| R- 290/03 | ඌව | බදුල්ල | කැප්පෙටිපොළ | කැප්පෙටිපොළ | හෙවනකුඹුර | 1. මාරගහ ඇල්ල<br>2. යොමුවෙල් තැන්න<br>3. මැටි ගක්ක<br>4. බොරගොල්ල<br>5. කිරිවල් බැද්ද | අර්තාපල් |
| R- 290/04 | ඌව | බදුල්ල | ඌවපරණගම | අඹගස්දෝව සහ වලගමුල්ල (පශු වෛද්‍ය නිලධාරී කාර්යාලය- ඌවපරණගම) | ඌමා ඇළ සහ ලුනුඅටුගම | 1. ඌමා ඇල<br>2. ලුනු අටුගම | සත්ත්ව පාලනය |
| R- 290/05 | වයඹ | කුරුණෑගල | ගල්ගමුව | ඇහැටුවැව | පොතානේගම | 1.බුල්නෑව<br>2.පහල ගිරඋගම<br>3.රැස්වෙහෙර<br>4.කඩදුන්නෑව<br>5.මහපොතානේගම<br>6.නීලකුට්ටියගම<br>7.පහල සියඹලෑව<br>8.මාකරගම 9.මොලගම | වී (සුළු වාරි) |
| R- 290/06 | මධ්‍යම | මාතලේ | දඹුල්ල | කිඹිස්ස | දිගම්පතහ | 1. දිගම්පතහ<br>2.නාගල වැව | බීළුණු |
| R- 290/07 | උතුරු මැද | අනුරාධපුර | පලාගල | ගල්කිරියාගම | අළුත් ගල්කිරියාගම | 1. 204-D5 ගම්මානය | මිරිස් |
| R- 290/08 | මධ්‍යම | නුවරඑළිය | හගුරන්කෙත | මන්දාරම්නුවර | උඩවෙල | 1.උඩවෙල<br>2.දෝතුරු කුඹුර | උඩරට එළවළු |
| R- 290/09 | වයඹ | පුත්තලම | කල්පිටිය | පාලවිය | පනෙයඩිය ඉලන්තඅඩිය | 1.පනෙයඩිය<br>2.ඉලන්තඅඩිය | රතුළූණු |